**වර්ෂ 2025. 10.31 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

**සභාපතිතුමා මුලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිළිගන්නා ලදී.විශේෂ මහ සභාව පෙ.ව. 9.30 ට ආරම්භ කරන ලදී.මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා සහභාගි විය.

| අනු අංකය | තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|---|
| 1. | ගරු සභාපති | ජා.ජ.බ. | එම්. විකසිත පුෂ්පසූරිය මහතා | 07.50 |
| 2. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.පී. මහින්ද ජයලාල් පතිරණ මහතා | 07.55 |
| 3. | ගරු ප්‍රා.ස.ම | ජා.ජ.බ. | කේ.වී.ආර්.ධර්මසිරි | 07.55 |
| 4. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඩී.ජී. ජස්ටින් රණවීර මහතා | 08.11 |
| 5. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා | 08.15 |
| 6. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ඩී. චූලා ශාන්ති | 08.20 |
| 7. | ගරු ප්‍රා.ස.ම. | ප්‍රජා.වාමාංශික 1 | එච්.එම්. සිසිර සේනාරත්න මහතා | 08.20 |
| 8. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඩී. ආශා සමන්කුමාරි | 08.20 |
| 9. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා | 08.49 |
| 10. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ටී. ඒ. රංගන විජේසුන්දර මහතා | 08.50 |
| 11. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා | 08.51 |
| 12. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා | 08.51 |
| 13. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එච්.වී. මහින්ද මහතා | 08.52 |
| 14. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ඩී.කේ. පී. කුමාර ජයනෙත්ති මහතා | 09.00 |
| 15. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඩබ්.ජයරත්න මහතා | 09.00 |
| 16. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඒ. දමින්ද නලින් අදිකාරම් මහතා | 09.05 |
| 17. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඒ. සෂිකලා මදුභාෂිනී | 09.05 |
| 18. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ඩී. පත්මසිරි දෙල්ගොල්ල | 09.05 |
| 19. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ජී. රංගනාත් ගහබඩගේ මහතා | 09.06 |
| 20. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන - 1 | අයි. මංගල කිත්සිරි ඩයස් මහතා | 09.07 |
| 21. | ගරු ප්‍රා.ස.ම | ස.ජ.බ. | ඉරෝෂා උදයන්ගනී විජේසිංහ | 09.07 |
| 22. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | අජිත් නන්දසිරි මනම්පේරි මහතා | 09.08 |
| 23. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එල්. සුධීරා සේමිනි ලියනගේ | 09.11 |
| 24. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ටී.එම්. උමේෂා මල්කාන්ති | 09.11 |
| 25. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්.ජී. එම්.නිරෝෂණ නාපාවල මහතා | 09.11 |
| 26. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.මහින්ද ගුණසිංහ මහතා | 09.10 |
| 27. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඒ. ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා | 09.12 |
| 28. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයාවතී මිය | 09.15 |
| 29. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | ජී.ඒ.ඊ. රනිල් එදිරිසිංහ මහතා | 09.16 |
| 30. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා | 09.18 |
| 31. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එච්. තනූජා දීපානි චන්ද්‍රකා | 09.19 |
| 32. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.එම්. ජයසේකර මහතා | 09.26 |
| 33. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඩී.ඒ. මොහාන් චන්දික අමරසේන මහතා | 09.27 |
| 34. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.පී. රොෂාන් මධුසංක දේශප්‍රිය මහතා | 09.30 |
| 35. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඒ. දේවින්ද කුමාර් මහතා | 09.31 |
| 36. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන - 1 | ඩී.එච්.හරිසිංහ මහතා | 09.31 |
| 37. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | ඒ. නයනා ජීවනී අතුකෝරළ මිය | 09.31 |
| 38. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි | 09.31 |
| 39. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | බී.ඒ. එස්.පී. කැලුම් ශ්‍රී ධර්මදාස මහතා | 09.35 |
| 40. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | සතා සිවම් චන්ද්‍රකුමාර් මහතා | 09.37 |
| 41. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.කේ. විජේසිරි මහතා | 09.40 |
| 42. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ආර්.එල්. එන් මල්කාන්ති ලියනගේ | 09.41 |
| 43. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | පී.වී. සුදර්ශන සම්පත් බොතේජු මහතා | 09.42 |
| 44. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | අනිල් ජගත් කුමාර ලියනගේ මහතා | 09.40 |
| 45. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්. ප්‍රේමරත්න මහතා | 09.55 |
| 46. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | කේ.කේ. දුමින්ද කසුන් අමරසිංහ මහතා | 10.05 |

**01.** යථාපරිදි කල්දී ඇති යෝජනා.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා විසින් සිදු කරනු ලබන යෝජනා.</u>

**01 – 01.** *කුරුවිට ප්‍රාදේශීය සභාවේ* **2026** වර්ෂයට අදාල අයවැය කෙටුම්පත සඳහා විශේෂ මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා-</u>

**1987** අංක **15** දරණ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව සැළසුම් කල **2026** වර්ෂයට අදාල අයවැය කෙටුම්පත විශේෂ මහා සභාවට ඉදිරිපත් කරනවා. විශේෂයෙන් ඉදිරි වසරට අදාළව අපේ බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට නියමිත පොදු ජනතා සුබවිහරණයට අයත්, සභාවක් ලෙස අපෙන් ඉටුවිය යුතු විශාල වැඩ කොටසක් තියෙනවා. ජනතාව වෙනුවෙන් ඉටුකළ යුතු ඒ වැඩ කරන්නේ කොහොමද යන්න පිලිබඳව සැළසුමක් අපට තිබිය යුතුයි. ඒ සැළසුම හදාගැනීම සඳහා අපි සියළු මන්ත්‍රීතුමන්ලාගෙන් උපදෙස් යෝජනා එකතු කරගෙන කෙටුම්පතක් හදාගැනීමට කටයුතු කළා. යෝජනා ගත්තා. එකතු වෙලා සාකච්ජා කළ. ඒ යෝජනාත් කලින් දී තිබුන යෝජනාත් උපයෝගි කරගෙන අපි මෙවර අයවැය කෙටුම්පත සැකසුවා. ඒ ඉටුකළ යුතු කාර්යන්ට අදාල එක් එක් වැයශීර්ෂ සඳහා මුදල් ආදායම් උත්පාදන කෙරේ අවධානය යොමු කලා. අයවැය හදනකොට පණතේ නියමිත ප්‍රතිපාදන අනුව එක් එක් වැයශීර්ෂ වලට මුදල් වෙන් කළා. ආදායම් උත්පාදනය ගැන විශේෂ අවධානය යෙමු කළා. **2026** වසරට අදාළව සභාවේ අයවැය සාරංශගත උත්පාදිත ආදායම රු. **166,569,094.49** ක්. ආයම් ආධාර රු. **54,187,457.18** ක්. ප්‍රාග්ධන ආධාර රු. **20,000,000.00** ක්. මේ සම්බන්ධ තොරතුරු සියළු මන්ත්‍රීතුමන්ලාට ලබාදී තියෙනවා. අපිට මෙවර අයවැයේදි වැඩිපුර මුදල් ආදායම් ලෙස වරිපනම් බදු රැස්වි තියෙනවා. **2025** දිත් අභියෝගයක් වි තිබුණා ආයම් ඉලක්ක සපුරා ගැනිම. ඒ ඉලක්ක සපුරා ගැනීමේදි වැඩිපුර වෙහෙසක් දරලා සැලකිය යුතු ප්‍රමාණයක් ආදායම් රැස් කළා. **2026** වසරට වරිපනම් අක්කර බදු ආදායම ඉලක්කගතව තියෙනවා රු. **14,106,380.33** ක්. ගිය වසරෙදි මේ ආදායම ඇස්තමේතුව රු. **6,460,090.14** ක්. ගිය වසරේ විශාල වශයෙන් මේ ආදායම් රැස්කිරිම සිදුකරලා ආදායම් තත්වය වැඩි කළා. පසුගිය දිනවලත් ඉතිරි ආදායම් රැස්කළා. **2026** වසරේදිත් ඉලක්කගත ආදායම් රැස් කරනවා. මේ සභාවට ආදායම් ලබාගත හැකි තවත් වැඩිකල හැකි ආදායම් මාර්ග රැසක් තියෙනවා. පසුගිය දිනවල ඒ සම්බන්ධව සාකච්ජා කළා. අවශ්‍ය යෝජනා ලැබුණා. ඒවා පිලිබඳව සළකා බලා ඒ යෝජනා ඇතුලත් කරන්න කටයුතු කළා. ප්‍රදේශයේ පවතින භෞතික සම්පත් උපයෝගිකරගෙන, මානව සම්පත් එකතුකරගෙන ඔබතුමන්ලාගේ මැදිහත්විමත් අරගෙන බලාපොරොත්තු වෙනවා ඒ තුලින් සභාවේ ආදායම් ප්‍රවර්ධනය වන ලෙස කටයුතු කිරිමට, සංවර්ධනය කිරිමට. ඒ සඳහා ඔබතුමන්ලාගේ යෝජනා වැදගත්.

අපේ නව ආදායම් ලබා ගැනීමේදි දැනට ආදායම් නොලබන විශේෂ තැන් රාශියක් තියෙනවා. සභාව සතු ගොඩනැගිලි, වෙනත් තැන් සභාවේ ආදායම් උත්පාදනයට අපිට යොදාගන්න පුළුවන්. විශේෂයෙන් කුරුවිට නගරයේ අර්ධ ලෙස වැඩ නිමවා ඇති සම්මන්ත්‍රණශාලාව ඉදිරි වසර තුල ඒක ආදායම් උත්පාදනය වන ස්ථානයක් ලෙස වැඩි දියුණු කරනවා. ඒ තුළින් සභාවට නව ආදායමක් ලබාගත හැකියි.

එසේම කිරිඇල්ල, පරකඩුව, ආදි පර්යන්ත නගර පිළිබඳව අවධානය යොමු කළා. කිරිඇල්ලේ වැසිකිළිය පිලිබඳව ඉල්ලීම් රැසක් තියෙනවා. මස් කඩය, මාළු කඩය, ගැටළු නිරාකරණය කරලා ඒ දේවල් සංවර්ධනය කරන්න මැදිහත් වෙනවා. එලෙස වියදම් පැත්තෙන් අපිට වෙනදාට වඩා වියදම් කරන්න වෙලා. වසර කීපයකට පෙර සිට අපි සේවක වැටුප් වලින් **20%** ක් සභාවෙන් දැරුවා. නමුත් **2026** වසරේ සිට **40%** ක් ලෙස වැඩිකරලා. ඒ මුදල අපි නීතිය අනුව දරනවා වගේම අපිට අයවැය සැකසීමේදි ඒ වෙනුවෙන් මුදල් වෙන් කරන්න සිදු උනා.

ඒවගේම අපි නව තාක්ෂනය තොරතුරු තාක්ෂණය භාවිතා කරලා ජනතා සේවය කාර්යක්ෂම කරන්න අවශ්‍ය මැදිහත්වීම් වලට මුදල් වෙන් කලා. බලාපොරොත්තු වෙනවා ඒ තාක්ෂණය එක්ක ජනතාවට හොඳ සේවයක් ඉටුකිරිමට. අපිට නව තාක්ෂනය එක්ක පුස්සැල්ල ආදාහනාගාරය වෙන් කිරිම වගේ කටයුතු වලදී සියළු තොරතුරු ඒ හරහා ලබාදිය හැකියි. ජනතාවට ඒක පහසුවක්. වෙබ් සයිඩ් වගේම විශේෂ ඇප් මගින්
මේ කටයුතු කල හැකියි. මේ තාක්ෂණ කටයුතු ප්‍රවර්ධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම ප්‍රදේශයෙ කැලි කසළ කළමණාකරන ආයතන එක්ක කතා කරලා කසළ සම්බන්ධයෙන් ඒ ගැටළු වලට හොඳ පිලිතුරක් ප්‍රගතිශිලී විසඳුම් ලබාගැනීමට අපි කටයුතු කරනවා.

තවදුරටත් ප්‍රදේශයේ වැඩිදියුණු කල හැකි ආදායම් තියෙනවා. ඉඩම් විකුණනකොට අපිට ලැබෙන බදු ආදායම් පිලිබඳව. ලැබිය යුතු මුදල් තියෙනවා. පසුගිය වසරතුළ මේ ඉඩම් විකිණිම සම්බන්ධයෙන් නැඹුරුවක් තිබුණා. ඒ හරහා අපිට ලැබෙන ආදායම් වැඩිවෙයි. ඉලක්ක වලට එහා යයි.

ප්‍රදේශයේ සෞඛය කටයුතු පිලිබදව මේ අයවැයෙන් අවධානය දුන්නා. වැඩි මුදලක් වෙන් කලා. සනීපාරක්ෂක කටයුතු හොඳින් පවත්වාගෙන යාමට බලාපොරොත්තු වෙනවා.

කාලයක් පරකඩුව පොල පැවැත්උනත් පසුව ඒක අහිමි උනා. දැන් නැවතත් පොළ ජනතාව වෙනුවෙන් ආරම්භ කිරිමට බලාපොරොත්තු වෙනවා. ජනතාවට හා ඒ පොළ භූමියේ වෙළඳ කටයුතු කළ ජනතාවට පහසුවක් වෙයි. අපි සාකච්ජා කළා. ලබන වසරේ මේ කටයුතු සිදු වෙනවා.

ළමා හා මාතෘ සායන කටයුතු අපි නඟා සිටුවීම සිදු කරනවා. ඒ පහසුකම් දෙන්න අපි මැදිහත් වෙනවා. සෞඛ්‍ය පහසුකම් වැඩි කරන්න, වසංගත රෝග පාලනය, අවධානය දෙනවා.

අපිට තියෙන සම්පත්. බෝපත් ඇල්ල සම්බන්ධව අපි පළාත් සභා ප්‍රතිපාදන මේ වසරේම ගන්නවා. ඒ මුදල් එක්ක අපි බෝපත් ඇල්ල පරිශ්‍රය තුළ අපිට ලැබෙන ආදායම් වැඩි කරගන්න කටයුතු කරනවා. අපි ඇස්තමේන්තු සැකසුවා. ලබන වසරේ ප්‍රතිලාභ ලැබෙයි. ඇල්ල හරහා අපි ඉලක්කගත ආදායම් ලබාගන්නවා. එසේම පාරිසරික, අයිතිහාසික ස්ථාන රැසක් අපිට තියෙනවා. ඒ ස්ථාන වැඩිදියුණු කරමින් අපිට ඒ හරහා ප්‍රදේශයට සංචාරක ආකර්ශනය වැඩිකරගැනීමට හැකියාව ලැබෙනවා. ඒ තුලින් ප්‍රදේශයට ආදායම් වැඩිකරගැනීමකට යා හැකියි. සභා ආදායම් වගේම වෙනත් ආයෝජන තුලින්ද රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් ද මේ කටයුතු වලට සහාය ලබාගන්නවා. ශ්‍රීපාද වන්දනා සමයේ ප්‍රදේශයට ඇදීඑන ජනතාව වැඩිකරගත හැකි තත්වයට පහසුකම් වැඩි කරලා නගරය දියුණු කරලා ආදායම් වැඩිකරගැනීමට කටයුතු කරනවා. විශේෂයෙන් අපිට අහිමි වෙලා තියෙන සිරිපා සමයේ කඩ කාමර වෙන්දේසිය සම්බන්ධව ඊළඟ වසරේ අනිවාර්යෙන් මැදිහත් වෙනවා. ඒ තුලින් අපිට යම්තාක් හෝ ආදාමක් ලබාගැනීමට කටයුතු කරමු.

කිරිඇල්ල පෙරපාසැල සම්බන්ධව අපි සංවර්ධන කටයුතු සඳහා මුදලක් වෙන් කලා. මේ පෙර පාසැල සම්බන්ධ කරගෙන ඒ සම්පත් භාවිතා කරලා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සම්බන්ධව අවධානය යෙමු කලා. ගොඩනැගිල්ල තියෙනවා. පිරිස ඉන්නවා. පෙර පාසැලේ සම්පත් භාවිතා කරලා අවශ්‍ය අනෙක් පහසුකම් දීලා ආදායම් නංවා ගත හැකියි.

මහජන පුස්තකාල අපිට 4 ක් තියෙනවා. ලක්ෂ 10 ක පොත් අපි වාර්ෂිකව මිලදී ගන්නවා. අපිට මේ පොත් සංඛ්‍යාව වැඩිකරගැනිමට ජනතාව හවුල් කරගැනීමට හැකියාව තියෙනවා. උදාහරණයක් විධිහට ජිවිතයේ වැදගත් දවසකට උපන්දිනයට වගේ මේ පුස්තකාල වලට පොත් පරිත්‍යාග කිරිමට පෙළඹවීම. ඒ වගේ දේවල් තුළින් පොත් අපිට වැඩිකර ගත හැකියි. උපක්‍රමශීලිව පුස්තකාල පරිහරණය කරන සංඛ්‍යාව වැඩිකරගත යුතුයි.
ක්‍රිඩා පිටිය හරහා අපිට සැලකිය යුතු ආදායමක් ලැබෙනවා. ඒක සංවර්ධනය වෙනුවෙන් අපි මුදලක් වෙන් කලා. දැනට ලැබෙන ආදායම වැඩිකරගන්න අපි නවින තාක්ෂනය සමාජ මාධ්‍ය උපයෝගී කර ගන්නවා.

අපේ වියදම් අඩු කිරිමත් වැදගත්. වාහන නඩතුතව, ඉන්ධන පිරිමැසීම කෙරේ අවධානයක් දුන්නා. ඒ සඳහා නව තාක්ෂනය උපයෝගී කරගෙන මැදිහත්වෙලා කටයුතු කරනවා. මේ සියල්ල මැද සංවර්ධන කටයුතු සඳහා තව දුරටත් අවශ්‍ය මුදල් පළාත් සභාව මගින් ලබාගැනිමට අපි කටයුතු කරනවා. ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් වඩා හොඳ සේවාවක් දෙන්න ගරු මන්ත්‍රි තුමන්ලා තුමියන්ලා මැදිහත් වෙන්න. බාධක අභියෝග එයි. නමුත් අපි ඒවා ට මුහුණ දෙමින් ඒවා පරාජය කරමු. මෙවර අයවැය කෙටුම්පත සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

මෙවර අයවැය කෙටුම්පත ඉදිරිපත් කරලා. ඉදිරි වසරක කටයුතු සම්බන්ධයි. මේක තුලින් ගම්වල ජනතාවගේ කටයුතු පිලිබඳ දෙන සේවාව පිලිබද සැලසුම් කරනවා. ගැටළුව මේ කෙටුම්පත අධ්‍යයනය කිරිමට කාලය ප්‍රමාණවත් නෑ. නිති රෙගුලාසි අනුව අපිට යම් ප්‍රමාණවත් කාලයන් දෙන්න ඕනි. මේ සඳහා අපිට කාලය තිබුනේ දින දෙකයි. රීති වල තෙවන පරිච්ඡේදයේ කියවෙනවා අයවැය පිලිබඳව සලකා බැලීමට ප්‍රමානවත් කාලයක් ලබාදිය යුතුයි කියලා. මේ කාලය මදි. අනික මේ අයවැය මහජන ප්‍රදර්ශනයට තිබ්බාද? ජනතාවට පරිශීලනය කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>
කුරුවිට ජනතාවට ඉදිරි වසරට කරන සේවය අන්තර්ගත කරලයි මේක සකසලා තියෙන්නෙ. ප්‍රතිලාභ මොනවාද? ආදායම් ක්‍රම මොනවා? වැඩි වියදම් අඩුකරගැනීම,මේවාට මේක බලන්න කාලය මදි. අපි කියන්නේ ඒකට තව කාලය දෙන්න. මහජන තොරතුරු ගත යුතුයි. පුවරුවක වගේ ප්‍රදර්ශනය කරන්න. කාලය දීර්ග කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා -</u>
අපේ ප්‍රවීන මන්ත්‍රිතුමාට මේ කෙටුම්පත බලන්න විශාල කාලයක් ඕනිළු. පැය 48 ක් තිබුණා. ඒ කාලය තුල ජනතාව වෙනුවෙන් කාලයක් මිඩංගු කරලා ඒක බලන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>
මූලාසනයෙන් ප්‍රශ්නයක් අහුවාම එයට පිලිතුරු දිය යුත්තේ මන්ත්‍රි වරයෙක් නෙවෙයි. මූලාසනයයි. උප සභාපතිතුමාට මේ ප්‍රශ්නය ආවේ නැද්ද?

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා-

මීට පෙර මේ අයවැය ගැන අපි සාකච්ඡාවක් තිබ්බා. අයවැය සැකසීම පිළිබඳවම. සියළු මන්ත්‍රීතුමන්ලාට ඒ සාකච්ඡාව දැනුම් දීලා අපි සැලසුම් කලා. එතනදී සිදුකල තොරතුරු සමාලෝචනය කරලා, යෝජනා අරන්, ලැබී තිබූ යෝජනා සලකා බලලා , වෙනස් කරලා, අරමුණු ඉලක්ක අනුව තමා මේ කෙටුම්පත හැදුවේ. ඒකට ඔබතුමා සහභාගී උනේ නැද්ද? මේ අයවැයට යෝජනා දීමට අපි උපරිම කාලය දුන්නා. සේරම කතා කරලා හැදුවේ. මේ අවස්ථාවේ මෙසේ ප්‍රකාශ කිරීම සුදුසු නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

ඒ සාකච්ඡාවේ සිදුවූ දේ පිලිබඳව තොරතුරු , විස්තර මම ලබා ගත්තා. ඒක වෙනම සාකච්ඡාවක් මේ කෙටුම්පත බලන්න වෙනම කාලයක් අවශ්‍යයි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

මේ කෙටුම්පතට අවශ්‍ය සංශෝධන දෙන්න. ඒ සංශෝධන සමග ඉදිරියට යමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -
අපි යෝජනා දුන්නා. නමුත් ඒවා මේකේ නෑ. මන්ත්‍රී අදහස් ගත්තාට ඒවා මේකේ නෑ. අපි මේකට අනුමැතිය දුන්නොත් මේකේ තියෙන දේ විතරයි වෙන්නේ. අපිට තවත් කටයුතු තියෙනවා. පුද්ගලික කටයුතු තියෙනවා. කාලය වැදගත්. මේ කටයුත්තට කාලය දෙන්න. දින දෙක මදි. අපේ යෝජනා මේකේ තියෙනවාද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා -
ඉදිරිපත්කල යෝජනා නැත්නම් ඒ තොරතුරු ගමු. එකතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -
දුන්න යෝජනා තමා නැත්තේ.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

මම මේක අනුමත කලා. නමුත් මේ කියන අදහස් ඒවාත් අනුමත කරනවා. රීති පෙන්වා දීම වැදගත්. ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දීම අවශ්‍යයි. මේ සභාවට ඉදිරිපත් කලේ කෙටුම්පතක්. අපි ඒක පෝෂණය කරුමු. එදා කියපු කරුණු නැත්නම් අපි ඒවා එකතු කරමු. තව ආදායම් උත්පාදන පෙන්වා දෙන්න. වියදම් කොහොමද? ඒවා පියවාගැනීම වැදගත්. මේක විශේෂ සභාවක්. තාර්කිකව කරුණු දෙන්න. සාමූහික වගකීමක්. මේක අද සම්මත කලාට අපි සංශෝධන මගින් පෝෂනය කරමු. වැය ශීර්ෂ තුල නිලධාරීන් පෙන්වා නොදුන් කරුණු ඇතුලත් කරමු. ඒකයි විය යුත්තේ. අද නොගැලපෙන අයවැය ඉදිරි සභාවේදි කොහොමත් ගැලපෙන්නෑ. ඒ නිසා තවත් යෝජනා තියෙනවාද? සංශෝදන තියෙනවාද?. මේක පුද්ගලික න්‍යාය පත්‍රයක් අනුව නොවිය යුතුයි. මුළු ජනතාවකගේ පොදු කටයුත්තක්. මෙතන ඉන්න මාත් සිසිර මන්ත්‍රීතුමාත් ඉනෝකා මන්ත්‍රීතුමියත් වාමාංශික. නමුත් ඒක පිලිඹිබු වෙන්න ඕනි. මම විපක්ෂෙ ඉන්නතාක් ඒක භාවිතයෙන් පෙන්නවා. 2026 අයවැය හදනකොට 2025 කොපිය තමා ඉලක්කම් දාලා වෙනස් කරන්නේ. ආදායමට කාණ්ඩ හයයි. වියදමට කාණ්ඩ හයයි. මේවා පිටු ගානක් ලිව්ය හැකියි. නමුත් ඒවා පියවා ගන්න

ආදායමත් ඕනි. මේ ප්‍රෙද්ශයේ ජනතා බදු මුදල්. වෙනත් ආදායම් තියෙන්නේ බෝපත් ඇල්ල විතරයි. පුංචි දිය දහරාවක් උනත් ඒක වසර ගානකට පස්සේ මහා දියදහරාවක් බවට පත්කලා. හොඳ ආදායම් උත්පාදනයක් කලා.
උසාවි දඩ සභාවේ ප්‍රධාන ආදායමක්. මන්ත්‍රී යෝජනාත් අරන් ඒකේ ජීව ගුණය ආදායමක් බවට පත්කරමු. කාගේවත් පක්ෂ බෙදීමක් නැතිව අපි මේ අදහස්, යෝජනා අරන් මේක පෝෂනය කරලා මේ අයවැය සම්මත කරමු. 2026 අයවැය කෙටුම්පත අපි තව දුරටත් සාර්ථක කරගමු. ජනතා අදහස් මේකට එන්න ඕනි. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලාගේ සහායත් ගන්න. මේකෙන් ලක්ෂ පහක් අරන් මොකක්හරි වැඩක් කරනවා කියන මානසික මට්ටමේ ඉන්න එපා. අවංකව මේ අයවැය සාර්තක කරන්න උදව් වෙන්න. කාටවත් අතනොපා කුරුවිට ප්‍රාදේශීය සභාවට ස්වාධීනව ඉන්න හැකියාව එන විධිහට කටයුතු කරන්න. මේක සහෝදරත්වයෙන් කරන ඉල්ලීමක්. මේ කෙටුම්පත පෝෂනය කරලා සම්මත කරමු. අපි වියදම් විතරක් කතා කරලා බෑ. ආදායමත් ඕනි. අත්‍යවශ්‍ය කටයුත්තක් හැර ණය ගැනනම් මට විශ්වාසයක් නෑ. ගත්තත් ගෙවන්න වෙනවා. ලබන වසරේ අපේ වැය වල 40% වැටුප් ප්‍රතිපූර්ණයකුත් තියෙනවා. පුද්ගලිකව මම කියන්නේ ආයතන වියදම් අඩු කරලා මහජන වියදම් වැඩි කරන්න. ගෙදර මුදල් වගේ පිරිමහන්න. කළමණාකරණය කරන්න. නිලධාරින්ට හිතුමතේට බිල් පියවන්න දෙන්න එපා. පරික්ෂා කරන්න. මූලික සිද්ධාන්ත අනුව කරන්න. ඉන්ධන පිරිමහන්න. ආයතන තුල වැඩි සතුට මහජන සේවය කරන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-</u>

මේක 2026 අයවැය කෙටුමපත. මංගල මන්ත්‍රීතුමාට කාලය මදිලු මේක අධ්‍යයනය කරන්න. මම දන්නවිදිහට දැනට අයවැය වාර්තා 30 කට වැඩිය අධ්‍යයනය කරලා ඇති. ඔබතුමාට නම් මේක ප්‍රශ්නයක් වෙන්න බෑ. මේ කෙටුම්පත සංශෝධනය කරනවානම් ඒ කොතනද? ඒවාට ගරු සභාව එකඟ නම් එකතු කරමු. ඉලක්කම් එක්ක කියන්න. මොනවා හරි කියලා වැඩක් නෑ. සභා එකඟත්වය අනුව එකතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා -</u>

අයවැය කෙටුම්පතේ අනතුරුගස් ආදායම පිලිබඳව තියෙනවා. ලක්ෂ 5 ක ඉලක්කගත ආදායමක්. මේ කාරණය බලනකොට 2025 දි මේ ආදායම අහිමි වෙලා. ඒක ලැබෙන්නේ නෑ. ආදායම් අඩුවෙනකොට කොහොමද මහජන සේවයට යොදවන්නෙ?
හැමදාම ලෙලන තලන යන්ත්‍රය ගැන තිබුනාට නඩත්තුවක් වෙන්නේ නෑ. කසළ ගැටළුව. අපේ ගමේ මේ සියළු කසළ නතර වෙන්නේ. කසළ සම්පතක් කරගෙන නෑ. මැසි මදුරු උවදුර, සතුන්ගේ හානි, පාසැල පන්සල එතනම. හිටපු සභාපතිතුමා යම් ක්‍රමයකට වල ක්‍රමයට මේ කටයුත්ත කලා. මේ වන විට ක්‍රමයට දැන් ඒකත් සිද්ධ වෙන්නෑ. පරිසර හානියක් සිදු නොවෙන ලෙස පාලනය කරලා නෑ. ඒක අයවැයෙන් අවධානයක් දීලා නෑ. පොහොරබාවට. අක්කර 10 ක භූමි භාගයක්. අපතේ ගිහින්.

අපි දීමනා ලබන අය. රු. 1000 න් විතර පටන් අරන් පස්සේරු. 23000 .00 දීලා දැන් ඒක 15000.00 ට බැහැලා. මේක කතා කරන්න ඕනි. පාලක පක්ෂයට විධායකය ,ව්‍යස්ථාදායකය ,අධිකරනය තියෙනවා. කතා කරන්න. මේ ගැන කටයුතු කරන්න. ඩිසල් ටික පැට්‍රල් ටික අතින් ගහගෙන වැඩ කරන මන්ත්‍රීලට කනේ පාරක් වගේ ලෙස කටයුතු කිරීමට විරුද්ධයි. මෙතන කතා නොකර බෑ. 40% ක් ලබන වසරේ සභාවෙන් වැටුප් වලට ගෙවන්න වෙන්නේ මහා බැංකුව ගිනිගත්තද? මේ විදිහට අපිට වැඩක් කරන්න වෙන්නේ නෑ. අපි නිහඬව හිටියාට පාලකයින්ට මේවා තේරෙන්නේ නැද්ද? මේවාට මම විරුද්ධයි. කලින් රටේ මූල්‍ය අර්බුධ රැසක් තිබුනත් මේ දේවල් නිසිපරිදි කලා. මේ විදිහට මහජන

සේවයට මුදල් මදි වෙනවා. ලයිට් අතින් දානවා. දේශපාලන ගමනේදි එහෙම තමයි. ගියවර හිටපු 45 න් 34 කට බැරි උනා ආයේ මේ සභාවට එන්න. මේ ඉන්න අයට වරම් ලැබෙයිද මේ විධිහට ආයේ මේ සභාවට එන්න. මේ ක්‍රමය යටතේ. මට ලොකු දුකක්. මේක වෙනස් වෙනවානම් හොඳයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

එදා අපි පරකඩුව පොලට පර්චස් 97 ක් ගත්තේ ලක්ෂ 17 ට. පරකඩුව තිබුන පොල නැති උනා. ඒකේ ව්‍යාපාරිකයෝ 55 ක් විතර හිටියා. දැන් එච්චර නෑ. දිගෝව පාරට මුහුණපාලා ඒ ඉඩම බලන්න. මේ අයවැය වෙන්කිරීම් ලක්ෂ 10 ප්‍රමාණවත් නෑ. කඩ කාමර 10 ක් හදන්න මදි. ඒ වගේම මේ ප්‍රෙද්ශයට පොදු ස්ථානයක් නෑ. සමිතියක් තියාගන්න තැනක් නෑ. එහෙම තැනක් දුන්නොත් පුස්තකාල සේවයක් පොදු කටයුතුවලට ගන්නපුළුවන්. සභාවෙන් කඩ හදලා දුන්නොත් ඒ මුදල් වගේම ලාභ ගන්න පුළුවන්. සම්මන්ත්‍රනශාලාව ඉතිරි කොටස හැදිය යුතුයි. කුරුවිටට ආසනන්නව මෙවැනි ශාලාවක් නෑ. වර්ග කිලෝමීටර් 263 ක් තියෙන මේ කුරුවිට සුන්දරයි. මිනිස්සු එනවා , සම්පත් සියල්ල හොඳයි. නමුත් අපිට අපේ ඇල්ල විතරයි යම් සංවර්ධනයකට ගන්න පුළුවන් උනේ. ජනාධිපතිතුමාට කියලා හෝ සංචාරක සැලැස්මට මේ සියල්ල ගමු. මේ පාරේ අනාගතයේ කෝච්චි යයි. ඒ වෙනකොට අපි සැලසුම්සහගතව මේ කුරුවිට සංචාරක කර්මාන්තයට ගැලපෙන ලෙස සැලසුම් කරමු. ගොඩනගමු. කොච්චි ආවත් නාවත් අපිට මේ ගමන යන්න පුළුවන්. සංචාරක කලාපයක් කරලා මේ බිම. බටදොඹ ලෙන බටතොට ලෙන මේවා සංචාරක ආකර්ශනය දිනාගත්ත තැන්. එරත්නේ ජනතාවට ආකර්ශනය දෙන තැන් රැසක් තියෙනවා. සංවර්ධනය කරන්න. සුදාගල ඇල්ල ,කොල්ලමලේ ඉතාම සුන්දර තැනක්. ප්‍රතිපාදන හොයාගෙන හරි සංවර්ධනය කිරීම වටිනවා. 40% වැටුප් ප්‍රතිපූර්ණය පිලිබඳව රජය දැනුවත් කරලා කටයුතු කරමු. ඉහල නිලධාරින් පළාත්පාලන කොමසාරිස් කාර්යාලය නෙමේ වැදගත්. මෙම් සභාවට ඊට වඩා තීන්දු තීරන ගන්න පුළුවන්. මේ ඉඩම් ආදායම් උසාවි දඩ ආදායම් වැදගත් උනාට ඒවා විකිනිලා ඉවර උනාම ආදායමත් ඉවරයි. වෙන්දේසි ඉවර උනාම. ඇහැලියගොඩ දැන් ඒවා නෑ. විකිනිලා ඉවරයි.
විජේසිරි මන්ත්‍රි තුමා කිව්වා වගේ පොහොරබාව ඒක අතහරින්න එපා. පාසැල ලඟයි. ඒක ක්‍රමවේදයකට කරන්න. එක්කෝටි හතලිස් ලක්ෂයක වැඩ. මාර්ග, ගොඩනැගිලි විදුලිය, වතුර ඒ ඉඩමත් මුදලට ගත්තේ. අක්කර 10 ක්. පළාත් පාලනය බැඳීම කුණුත් එක්ක. ඒකට විධිමත් සැලසුමක් ඕනි. පොහොරබාවට ලක්ෂ 15 මදි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

කසළ කලමනාකරන වැඩපිලිවෙල හදනවා. විශේෂයෙන් කසල වෙන් කර ගන්න. පොරබාව විශේෂ ව්‍යාපෘතියක් ලෙස අපි කටයුතු කරනවා. පළාත් පාලන කොමසාරිස් එක්ක කතා කලා. ඒක කරමු. ඒ වගෙම පරකඩුව පොල නැවත පටන් ගන්නවා. එතන බිම හදලා කඩ කාමර ඒ අයටම හදාගන්න මැදිහත් වෙන්න කියන්නේ. ප්‍රමාන ගැන අදහස් ගන්න ඕනි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -
අංක 05 පොදු මහජන උපයෝගිතා සේවා. වැටුප් වලට 40% ක් ගියාම සංවර්ධන කටයුතු කරන්න මදි වෙනවා. ඒ නිසා ඒ සංවර්ධන කටයුතු වලට මුදල් වැඩිකරගන්න ඕනි. පරකඩුව සතිපොලට මුදල් රු. ලකෂ 10 ක් දාලා. ලක්ෂ 10 ඉඩම සුද්ද කරන්නත් මදි වෙයි. ස්ථාවර තැම්පතු මුදල් සභාවට සම්පතක් ලෙස තිබිය යුතුයි. නමුත් අනුමැතිය අරන් ලක්ෂ 17 ක් මේ කටයුත්තට අරගත්තා. පරකඩුව පත්බේරිය මේවන විට පර්චස් එකක්

ලක්ෂ තුනෙන් එහා වෙනවා. පරකඩුව සතිපොල ලෝක යුද්ධ සමයේ ආරම්භ කල එකක්. කොරෝනා සමය දක්වා තිබුනා. අඩු මිළට ජනතාවට අළුත් දේ ගන්න මේ පොල ඉවහල් උනා. මේ ලක්ෂ 10 නම් පොල කටයුතු වලට මදි වෙයි. සභා මුදල් යොදවලා රජය මැදිහත් වෙලා කඩ හැදුවොත් හොඳයි. නැත්නම් ඒ අයට හදන්නකියලා අන්තිමට යන්න බෑ කියලත් කියයි. අයිතිය කියන්නත් එයි. සමාජ මාධ්‍ය භාවිතා කරලා ප්‍රචාරයක් දීලා මේ පොළ නැවත ආරම්භ කරන බව දැනුම්දෙමු. ණයක් ගත්තත් වාරික ගෙවන්න පුළුවන් විධිහට ආදායමක් ගන්න පුළුවන්. කඩ බදු දීලා. අපි ආයෝජනය කරලා මුදල් ගමු. 2026 පලමුවන බ්‍රහස්පතින්දා සිට මුදල් උපයන්න පුළුවන්. මේක කඩිනම්ව කලොත්. වෙන දෙයකට යොදවන මුදලක් හෝ මාස තුනකට නවතලා මේ කාර්ය කලොත් මේක ලාභ ලබනවා. වටිනා ස්ථානයක්. දැන් තත්වය ඉතා අශෝභනයි. කැලෑව වැවිලා. මාර්ග කානු සියල්ල තියෙනවා. මේ කටයුත්ත කරමු.
එසේම දිද්දෙනිය තේ කර්මාන්ත ශාලාව ගිණිතියපු ඉඩම හරියට නුවරඑළිය වගේ ඒ හරියේ දේශගුණය. වතු සමාගමට කියලා ඒ ඉඩම අවුරුදු 50 කට විතර බදු අරන් සංවර්ධනය කරලා නවීන තාක්ෂනය දීලා නිවාඩු නිකේතනයක් වගේ හැදුවොත් සංචාරක ආකර්ශනය ලැබෙයි. ඉතාමත් සුදුසු සංචාරක ප්‍රිය කරන පරිසරයක් තියෙන්නේ.

රට ජාත්‍යන්තරයට යැවිය හැකි තැනක්. කුරුවිට සම්මන්ත්‍රන ශාලාව. ටියුෂන් කලත් මේක සභාවට ආදායම් උත්පාදනය වන තැනක්. මෙහේ ළමයි වියදම් කරගෙන නුගේගොඩ යනවා. ටියුෂන්. අපිට පුළුවන් ඒ ගුරුවරු මේ ස්ථානයට ගෙන්නලා ඒ ටියුෂන් මෙහේම කරන්න. ප්‍රෙද්ශයට ආදායමක්. සම්මන්ත්‍රණ, නාට්‍ය, නර්තන ඕනෑම එකක් පෙන්නන්න විධිහට පහසුකම් දීලා සංවර්ධනය කලොත් ඉතාමත් වටිනවා. ඒකට කෝටියක් විතර යයි. අපේ වැයශීර්ෂ මාරු කරලාලු. මේක බොරුවක් වගේ. ඒ මුදල් වලට එහෙම කරන්න එපා. අත්‍යවශ්‍යතාවකට නම් කලාට කමක් නෑ. නාය යාමක් ගිය වෙලාවකදි මල්කැකුල සභාපතිතුමා එහෙම දෙයක් කලා. ඒවාගේ දේකට නම් කමක් නෑ. 40% වැටුප් ප්‍රතිපූර්නයත් අපිට අවාසියක්. ජනතාවට සහන දෙන්න තියෙන මුදලක්. මංගල මන්ත්‍රී තුමා කියන විධිහට නීතියට වැඩ කරමු. නැවත අධිහාරවලට යන්න බෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  මහින්ද ජයලාල් පතිරණ මහතා -</u>

පරකඩුව සතිපොල භූමිය. ඒ ස්ථානයේ සතිපොල හැදුවාම වැසිකිළි පහසුකම්, යටිතල පහසුකම් දෙන්න වෙනවා. නිල්මිණි උයන, පිච්චමල් ලන්ද, ජනතාව ඉල්ලනවා ඒ ප්‍රදේශයට  ප්‍රජා ශාලාවක් නැති නිසා ඒ ස්ථානයෙන් පර්චස් 5 ක් වගේ ප්‍රජාශාලාවක් හදන්න.  ඒ අය හදාගනී.
පොළභූමිය ළගම බස්නැවතුම්පලක් යෙදීම වැදගත්. ඒ තුලින් ඒ ස්ථානයේ ගැවසෙන ජනතාව වැඩි වෙයි. මාර්ග තදබදයත් අඩු වෙයි. කුරුවිට, ඇහැලියගොඩ යන පිරිස් මග බැහලා ආපහු මේ පොලට එන්නේ නෑ. නමුත් බස් නැවතුමක් තිබුනොත් ඒ ජනතාව මේ පොලට එයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී   එම්. ප්‍රේමරත්න මහතා -</u>

පර්චස් 5 ක් දීම ගැලපෙන්නේ නෑ. දැයට කිරුළ වැඩසටහනින් මේ කටයුතු වලට  මුදල් වෙන් කලා. රජය මැදිහත් කරගෙන රැස්වීම් තියන්න තැනක් හදලා දෙන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>
සම්මන්ත්‍රණශාලාව පිලිබඳව එක්තරා සිනමා කටයුතු සම්බන්ධ ආයතනයක් විමසුවා. ඒ අය ඉතිරි වැඩ සියල්ල කරලා ඒක සිනමා ශාලාවක් විධිහට සංවර්ධනය කරලා පවත්වාගෙන

යන්න. ඒ අය රු. ලක්ෂ පහක ආදායමක් සහතික කරනවා. වෙන වියදම් නෑ. වැඩිදුර සාකච්චා කරමු. මේ කටයුතු එක්ක වැඩිපුර සෙනඟ ඇදී එයි. නගරයට. ව්‍යාපාර අවස්ථා වැඩිවෙයි. අපිට සම්මන්ත්‍රණශාලාව ඉතිරි කටයුතු සිදුකරන්න ප්‍රමාණවත් මුදලක් යොදවන්න අපහසුයි. නමුත් මේ විධිහට කලොත් වැය බරක් එන්නේ නෑ. දැනට ඒ අය වෙනත් සභා එක්කත් මේ කටයුත්ත කරනවළු. ලියාපදිංචි ආයතනයක්. අපි සාකච්ජා කරමු.

පරකඩුව පොල බිම අපි කඩිනමින් ආරම්භ කරමු. ක්‍රමවේදය තීරණය කරගෙන කඩිනම්ව කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මධුශංක දේශප්‍රිය මහතා -</u>

පරකඩුව නගරයට වැසිකිලි නෑ. ජනතාව බහුලව ගැවසෙනවා. පරකඩුව පොල සැකසීම සභාවට හොඳ ආයෝජනයක්. බස් රථ නැවතුමක් වගේම වැසිකිලියක් ආසන්නව හැදුවොත් ජනතාව නිතර ගැවසෙයි. යටිතල පහසුකම් දීම තුලින් ජනතාව බහුල කරගන්න පුළුවන්.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

හිටපු ගරු සභාපති කේ.එම්. ගුණවර්ධන මහතාව සිහිපත් කරනවා. ස්ථිර තැම්පතුව ආරක්ෂා කලා. මම කියන්නේ මේ තැම්පතුවට තව ලක්ෂ 50 ක් එකතු කරන්න.
මනං ඇල්ල 2026 සංවර්ධනය කරන්න. මේ කටයුත්තෙන් අවම ලක්ෂ 5 ක ආදායමක් ලබන්න පුළුවන්. අවශය වෙන්නේ මේ ඇල්ල පිලිබදව පුවරු කීපයක් සවිකිරීම විතරයි. ස්ථානය පිරිසිදුව තැබිය යුතුයි. වගකීමක් විධිහට. මුදල් මදිනිසා එකවර වියදම් කරන්න අපහසුයි. පරකඩුව පොලභූමිය පවිත්‍ර කිරිම ටෙන්ඩර් කරන්න. කරලා ව්‍යාපාරිකයින්ට බිම්බදු දෙන්න. දෙවනුව ස්ථිර ගොඩනැගිලි වලට යමු. මේ ව්‍යාපෘති සම්බන්ධව කණ්ඩායම් යොදවලා කටයුතු කරන්න. මනංඇල්ල අසලම වාහන පාක් එක තියෙනවා. ආසන්නයේ යේ තමා නාච්චිමලේ ඇල්ලත් තියෙන්නේ. වෙනත් ආයතන උදව් අරන් හෝ මේ කටයුත්ත කඩිනම් කරමු. නිලධාරීන් මේ කටයුතු වලට මැදිහත් වෙන්න ඕනි. මංගල මන්ත්‍රීතුමාගේ පෙට්ටගංවල ත් සුන්දර ස්ථානයක්. නාන තටාකයක්. වර්ණගල දේශගුණය සංචාරකයින්ට කදිමයි. කොල්ලමලේත් ඉතාමත් සුන්දර සුවදායි තැනක්. නාම පුවරු විතරයි ගහන්න තියෙන්නේ. සංචාරක කර්මාන්තයෙන් අවමය ලක්ෂ 5 ක්වත් වැඩිකරගමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි නයනා ජීවනී අතුකෝරළ මිය -</u>
මට අයවැය වාර්තාව ලැබුනේ දින එකකට පෙර. ඒ කෙටුම්පත කඩයක තියලා. මට නොදන්වා. මේවා බෙදීමේදි වගකිවයුතු ලෙස කටයුතු කරන්න. සේවකයෙක් අතින් මේ දේ සිදුවෙලා තියෙන්නේ. මට කතා කලා. නමුත් මෙය නීතිය අනුව සිදු විය යුතුයි. කුරුවිට කිරිඇල්ල හෙල බොජුන් හල් දෙකක් දමමු. සංචාරක ක්ෂේත්‍රයට මේක ඉතා වැදගත්. දේශීය ආහාර පිරිසිදුව ගන්න. හැකියාව තුලින් ආදායම් ප්‍රවර්ධනය කරගත හැකියි. කිරිඇල්ල හෙළ බොජුන්හලට ලක්ෂ එකක් නම් මදි. තාවකාලික ගොඩනැගිල්ලට වත් ලක්ෂයක් මදි. මම කුරුවිටටත් මීට පෙර ඉල්ලුවා. අඩු ආදායම් ලාභී කතුන් 10 ක් පුහුණු කරලා මේ වැඩේට යොදවන්න යෝජනා කලා. කතුන්ට රැකියා අවස්ථා ටිකක් දෙන්නත් පුළුවන්. හෙළ බොජුන් හල් දාමු කුරුවිටටත්.

40% වැටුප් ප්‍රතිපූර්ණය අයි.එම්.එප් යෝජනා. රජයේ වියදම් අවම කරන්න. ඒකට මේ පළාත්පාලන ආයතනත් තෝරාගෙන. පොදු ජනතා සුභසාධනයට සමීපම ආයතන පළාත් පාලන ආයතන. අපිටම බඩේ පාර ගහලා. මන්ත්‍රී වරප්‍රසාදත් එහෙමයි. සේවකයින්ගෙන් ඇත්තටම රාජකාරි නිසිලෙස ඉටුවෙනවාද? ඒ ගැනත් සොයාබලන්න.

පළාත් පාලන ආයතනවලට රජයෙන් ලොකු බරක් දාලා. ඒ ගැන කනගාටුව පල කරනවා. සංවර්ධනය කටයුතු අඩපන වෙයි. ඒ නිසා නව ආදායම් වලට යන්න වෙයි. වසර 5 ක් යනකොට අපිව අමාරුවේ වැටෙනවා. දැන්ම ඉඳන්ම ලැස්තිවෙමු. ඒ තත්වයෙන් ගොඩ යන්න. අපිත් සංචාරක බංගලාවක් හදමු. ඒක විශාල ආයෝජනයක්. නුවරඑලියේ විශාල මිල ගනන් වලට යන්නේ. ආයෝජනය කලොත් අපතේ යන්නේ නෑ. මේ කෙටුම්පත සංශෝධනය වෙලා නෑ. කිරිඇල්ල හෙල බොජුන් හලට මුදල් ප්‍රමාණවත් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මයා -
පරකඩුව ක්‍රිඩා පිටිය සභාවට පවරාගත්තොත් කුරුවිට පිටිය වගේ ආදායම් ලබන්න පුළුවන්. පවරා ගැනීමේ කටයුතු සිදුකල යුතුයි. ඇහැලියගොඩ පිට්ටනියට පස්සේ තියෙන්නේ මේ පිටිය. අඩු කාලයක් තුල මේ පිට්ටනිය පවරා ගමු. බොතේජු මන්ත්‍රි තුමා කිව්වා වගේ අර දිද්දෙනිය නිවාඩු නිකේතනයක් හැදුවොත් ආර්ථික වාසි සහගත වෙයි. මාතෘ සායනයේ දැනටම ජල ගැටළුවක්. සායන පවත්වන්න විධිහක් නෑ. මැදිහත්වෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. වි.මහින්ද මයා -
අනවශ්‍ය ලෙස කාලය අරන් වේලාව නිකරුනේ වැය කරන්න එපා. ලක්ෂ 75 ක් විතර ජනතාවගේ ගැටළු පිලිබඳව කතාකරන්න තියෙන මේ කාලය කණ්ඩායමක් ලෙස පලදායි හා සාමුහිකව කටයුතු කරමු. අපි ආදායම් වැඩිකල යුතුයි. කිරිඇල්ල පිට්ටනියක් තියෙනවා. නගරයේ පොදු ක්‍රිඩාංගනය. විශාල මුදලක් දරන්න අවශ්‍ය නෑ. පොදු පහසුකම් දිලා කුරුවිට වගේ අයකිරිම් කරමු.
වාහන වලට ඉන්ධන ගැසීම. ඇතැම් ස්ථානවල මෙය මලකැපීම ලෙස ව්‍යවහාර කරනවා. මේ කටයුත්තට නිලධාරියෙකුට බලය පවරා අධීක්ෂනයකරන්න. වගේම නීත්‍යානුකූලව අනවශ්‍ය බලපෑම් නැතිව කටයුතු කරන්න ඔහුට අවස්ථාව සලසන්න.

වරිපනම් ප්‍රෙද්ශ තව දුරටත් පුළුල් කරලා, කසළ කළමණාකරනයේදි කසළ වෙන්කර ගැනීම පිලිබඳව දැඩි අවධානය දෙන්න. ඒ කටයුත්ත නිසි ලෙස කරවන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මයා -
කුඩා ජලවිදුලි බලාගාර තුලින් අපේක්ෂා කල පරිදි ආදායම සභාවට ලැබෙන්නේ නෑ. සභාවට අයකරගතුයුතු ආදායම් බහුලයි. ඒවා ක්‍රමවේදය අනුව ලැබෙන්නේ නෑ. මේ බලාගාර ගැන නිලධාරින් කැඳවලා එක්වෙලා කතා කරමු. මෙතන කතා කලාට ප්‍රායෝගිකව නැත්නම් වැඩක් නෑ. එරත්න සිරිපා සමයේ කඩ සම්බන්ධව මම නිතරම කතා කලා. අපිට ඒ ආදායම අහිමි වෙලා. විශාල ආදායමක්. ප්‍රාෙද්ශීය ලේකම් සියළු ආදායම් ගන්නවා. සභාව වැය කරනවා විතරයි. නිලධාරින්ට මේවා ගැන කටයුතු කරන්නකාලයක් දීලා මේ සියළු දේ තුලින් ආදායම් ගන්න කටයුතු කරමු. ඒ ආයතන බලන්නේ ආදායම් නොදී ඉන්න. ඒ නිසා හැකි උපරිමය උත්සාහ කරලා අපිට ආදායම් ලබාගමු. මන්ත්‍රිවරු අදහස් දක්වපු දිය ඇළි, ඒවායේ පුවරු සවිකරලා ඒ ආදායම් ගන්න. අපිට විශාල වියදම් යන්නේ නෑ. ගතහැකි ආදායම් අපි ගමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මයා -
අද මේ අයවැය පිලිබඳව කතා කිරීමේදි ජේෂ්ඨ මන්ත්‍රිවරු අපිව විවිධ රිති සම්බන්ධයෙන් දැනුවත් කලා ස්තුතියි. අපි කලින් දන්නා දෙයක් ලංකාවේ විශාලම සභාවක් මේ කුරුවිට ප්‍රාදේශීය සභා ව කියලා. විශාල ආදායමක් ලබනවා ඒකෙන් ප්‍රෙද්ශයේ වැඩ කරනවා කියලා. නමුත් මේ වන විට ආදායමට වඩා වියදම වැඩිවෙලා. එසේම විශාල ආදායම් ලැබිය හැකි බවට මන්ත්‍රිතුමන්ලා අදහස් දැක්වූවා. ඒත් ඇයි ඒවැනි ආදායම් ලබන්න මීට පෙර කටයුතු නොකලේ ? මෙතෙක් එතනට නොගියේ ඇයි?. හේතුව පිල් බෙදීම නිසාද? අපිට

අවශ්‍ය මහජන සේවය මිස දේශපාලන මත ඉදිරියට ගෙන යාම නෙවෙයි. සියළු දෙනාම මහජනතාව වෙනුවෙනුයි කටයුතු කල යුත්තේ. මෙතන හුදු පිල් බෙදිම එපා. අපි පාසැල් ගිය කාලෙට වඩා පොඩි දියුණුවක් විතරයි කුරුවිට නගරයෙන් විද්‍යාමාන වෙන්නේ. අපි මේක ඉහලට ගමු. මන්ත්‍රීතුමන්ලා සංචාරක ව්‍යාපාරය ගැන අදහස් දැක්වුවා. සංචාරක ආකර්ශනය ට සම්පත් කුරුවිට තුලින් දිස්වෙනවා. ඒවාට අවශ්‍ය සම්පත් කුරුවිට තියෙනවා. මිට ඉහතදී සංචාරක ක්ෂේත්‍රය පිලිබඳව විද්වත් පිරිසක් ආවා. ඒ අය සංචාරය කරලා ස්ථාන හඳුනාගෙනඅධ්‍යනය කරලා පොතක් ලියලා තියෙනවා. මේ ප්‍රෙද්ශයේ විදේශීය සංචාරකයින්ට සුදුසු යටිතල පහසුකම් නෑ. කුරුවිට නගරයේ ගඟ අසල පාලම ලඟ. නැරඹුම් කුටියක් වගේ තියෙන තැන තහඩු එහා පැත්තේ නිවෙස තුලට වැටිලා. ඒ කුටිය ප්‍රයෝනයට අරන් නෑ. ඉස්සර උදේ හතේ ඉඳන් ජනතාව එතන නානවා. දැන් නෑ. නගරේ ජරා වතුර කානුව ඒ ස්ථානය අසලින් ගගට වැටෙන්නේ. ඒ ස්ථානය නිසිලෙස හදලා නඩත්තු කලොත් යම් ආදායමක් ගත හැකියි. අපේ කීපදෙනෙක් කිතුල්ගල බෝට්ටුසේවය කරන අයෙක් එක්ක ඒ පාලම ලඟ ඉඳන් ඇල්ල ලඟට ගිහින්. බෝට්ටුවකින්. මේ කටයුත්ත සංවර්ධනය කල හැකි නම් කරමු. සභාව මුල්වී කල යුතුයි. කිතුල්ගල දැනටත් මේ සේවය කරන පුද්ගලයෙක් ඉන්නවා. ඔහුගේ සහායත් ගන්න පුළුවන් වෙයි.

නගරේ සිරිපා සමයට ඉස්සර විශාල පිරිසක් ආවා. පසුගිය කාලේ 2023 විතර මගේ හිතවත් අයෙක් ආවා වර්ණගල ගියා ඔහු ගේ බිරිඳ එක්සත් ජාතින්ගේ සංවිධානයේ නියෝජිතයෙක්. සේනක අනුරුද්ධ මහාචාර්යවරයා. වර්ණගල එරත්න අපි ගියා. මුළු දිනයක්ම අධ්‍යනය කලා. ජල විදුලි යෝජනා ක්‍රමයටත් ගියා. වර්ණගල යම් අධ්‍යයන මධ්‍යස්ථානයක් ලෙස පිහිටුවිමට ඔවුන් කැමතියි. පොඩි ඉඩක් දුන්නොත් වන සත්තු ගහකොළ ආදි පිලිබඳව පරික්ෂා කරන අයට ඇවිත් ඒ කටයුතු කරන්න සුදුසු ලෙස ස්ථානයක් හදයි. ආදායම් ලැබිය හැකි මාර්ගයක් කල හැකියි. වර්ණගල බැලුම් සේවාවක් පවත්වන්න පුළුවන්ලු. ආයෝජකයන්ගෙන් බැලුම් ලබාගන්න පුළුවන්. ශ්‍රීපාද මාර්ගය හදන විට ඒ පැත්තේ ජනතාව ඒ සඳහා සහාය වෙන්නම් කිව්වා. එරත්න ජනතාව ඒ සඳහා එනවා කිව්වා. පරිසරය රැකෙන පරිදි කටයුතු කලයුතුයි. අඩි එකහමාරේ පමන පඩිත් තියෙනවා. තැන තැන මාර්ගය හදන්න ඕනි. ස්වේඡාවෙන් ගල්වැලි සපයා ගන්න පුළුවන්. මුදල් නැතිව ගන්න පුළුවන්ළු. යුධ හමුදාව මගින් කරනවා නම් තවත් හොඳයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මයා -</u>

මේ කටයුත්ත හමුදාවට දෙන්න කියලා මම කලිනුත් කිව්වා. රත්නපුර පලාබද්දල මාර්ගය වගේ ලස්සනට කරයි. හේරුමණ්ඩිය ව්‍යාපෘතිය අතරමග නැවතුනා. වනසංරක්ෂනයේ නීතිය. ගඟෙන් වැලි අරන් කියලා. ඒවා ගැනත් සලකා බලන්න. සීත ගගුලේ හැම වාරෙම බිල්ලක් ගන්නවා. පසුගිය වාරෙත් කුඩා දරුවෙක් බිලිගත්තා. පාලම දැමීමේ කටයුත්ත කඩිනම් කරන්න. ජනතාවගේ ඉල්ලිමක්. සමන්දෙවියෝ වඩිනකොට පෙලක් වෙලාවට ගඟ ගලලා. සභාව මැදිහත්වෙලා මේ කටයුතු කඩිනම් කරන්න. අපි උදව් වෙනවා. වර්ණගල අවසානේ අම්බලම ලඟ ,ටැංකි දෙක ලඟ ලොකු වාහන පාර්ක් එකක් හදන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මයා -</u>

වාහන දාන්න තැනක් නෑ. බස් එන්නෙත් නෑ. ඒකය් හැටන් එකෙන් මිනිස්සු වැඩිය යන්නේ. වාහන පාක් එක පහල හැදුවොත් හරි. ඒ වගෙම කලින් කිව්වා වගේ පෙට්ටගම්වල වලදූර මහඇල ගැන මැසිවිලි නගනවා. ඒ නිසා යම් සංවර්ධනයක් කරලා ඇල්ල ලඟ වගේ ආදායම් ඇතිකර ගන්න වැඩපිලිවෙලක් හදමු.

මුළු නගරය පුරාම සතිපොල. පහසුකම් ඇති පොලක් හදලා දෙන්න පුළුවන්නම් ලොකු ආදායමක් ලබන්න පුළුවන්. සම්මන්ත්‍රනශාලාව යම් පර්මාර්ථයක් ඇතිව කල දෙයක්. මේක ප්‍රයෝජනවත් කටයුත්තකට යෙදවිය හැකියි. සිනමාශාලාවකට දෙනවා නම් සභාවට ආදායම් එනවා. වියදමක් නැතිව. මේ ක්‍රිඩා පිටිය ක්‍රිකට් වලට විතරළු දෙන්නේ. මටත්

කිව්වා මේකේ වොලිබෝල් පිටියකුත් සංවර්ධනය කරන්න කියලා. ඒ ක්‍රීඩා වලටත් දෙන්න. කුරුවිටට ළමාක්‍රීඩාංගනයක් එක්ක ළමා උද්‍යානයක් හැදුවොත් තවත් ආදායම් ගත හැකියි.
40% වැටුප් සම්බන්ධව ඒක IMF යෝජනා නෙමේ. ආර්ථික අර්බුධ එක්ක එතැනට යන්න වෙලා. අපිට මුහුණදෙන්න වෙනවා. ආයතනයේ ආර්ථික මට්ටම වැඩි කිරීම තමා කල යුත්තේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  කේ.වී.ආර්.ධර්මසිරි මයා -</u>
බටුගේන ප්‍රජා ශාලාව අසල ලොකු ක්‍රීඩා පිටියක් තියෙනවාත. වොලිබෝල් පිටියක්. ඒ පිටිය පවරා ගත්තොත් විශාල ආදායමක් ලැබිය යැතියි. පාසැලේ වාර්ෂිකව ක්‍රීඩා උත්සව පවත්වනවා. එවැනි තැනක් සංවර්ධනය කරලා පවරාගැනීම් කලොත් ආදායම් වැඩිකරගත හැකියි. පැරඩයිස් වැව වටේ මං තීරු හදලා බෝට්ටු සවාරියක් සේවා දුන්නොත් සංචාරකයින් වර්ධනය වෙයි. මැණික් ව්‍යාපාරිකයෝ ඉන්නවා. දේශීය, විදේශීය ප්‍රෙද්ශයේ සංචාරය කරන සංචාරකයෝ එයි. යම් ආදායමක් ලැබිය යැකියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  දේවින්ද කුමාර මයා -</u>
අද ප්‍රශ්න තුනක් ඇහුවා මූලාසනයෙන් ඒවාට ඍජු උත්තර ලැබුනේ නෑ. සම්මන්ත්‍රණශාලාවට යම් මුදලක් දමලා. නගරසංවර්ධනයේදි ඒකමතිකව තීරණය කල දෙයක්. ඒ මුදල් ගත්තද? නැවත කෝටි 1 ක මුදලක් යොමු කරලා. ඒ මුදල් ගත්තේ මොකටද? විජේසිරි මන්ත්‍රී තුමා ඇහුවා මන්ත්‍රී වරප්‍රසාද ගැන. මෙතනට එනවට අපිට රු. 20 ක් තමයි කිලෝමීටරයට ගෙවන්නේ. නයනා මන්ත්‍රීතුමිය කිව්වා ත්‍රිවීල් ඉන්ධන ලෙස ලක්ෂ 4 ක් යොමු කරලා කියලා. අපි පොදු කටයුතු වලට යන්නේ. රු. 20 යි. මෝටර් සයිකල් ත්‍රිවිල් උනොත් රු. 10 යි. අපිව කප්පාදු කරලා රට සංවර්ධනය කල හැකිද? IMF පිලිගන්නේ නෑ කියලා රජය පිහිටුවලා දැන් අදහස් වෙනස් කරලා. 40% වැටුප් කටයුත්ත කලොත් තව අවුරුදු පහෙන් ඉවරයි. මේ සියළු බදු ජනතාවට පටවන්න බෑ. අපේ සියළු යෝජනා අවුරුදු 5ට සියල්ල ක්‍රියාත්මක වෙන්නේ නෑ. ඇල්ල විදුලිබලාගාර කතාකලාට වැඩක් නෑ. කවදාදා ඒ කටයුත්තක් අවසන් වෙන්නේ? පාර්ලිමේනතුවත් එකතුවෙලා කියන්නකෝ IMF තීරක ක්‍රියාත්මක කරන්න බෑ කියලා. මට කිලෝ මීටර් 18 ක් යනවා. සභාවට යන්න එන්න. පුද්ගලිකව අතින වියදම් කරගෙන අපි එනවා. දුරකථනය කොපමන ජනතාව වෙනුවෙන් අපි බිල ගෙවාගෙන කටයුතු කරනවද? ඉස්සර දුරකථන දීමනා දුන්නා. දැන් ඇයි බැරි? මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ඉවත් කරලා. එසේ කරන්න එපා. එරත්න බලාගාර ගැන එදත් කිව්වා. සිරිපාදේ කඩ ගැනත් කිව්වා. අදත් කියනවා. කිරිඇල්ල සංවර්ධනයත් එහෙමයි. මේ කටයුතු සිදුවෙයිද විශ්වාසයක් නෑ. මෙතන නැතිබැරිකම් තියෙන මන්ත්‍රීවරුත් ඉන්නවා. බස්එකේ එන අය ඉන්නවා. ඒ නිසා මේ විධිහට මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ඉවත් කරන්න එපා. අදාල ස්ථාන වලට දැනුම් දීලා මේ මන්ත්‍රී වරප්‍රසාද ලබාදෙන්න කටයුතු කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  මංගල ඩයස් මයා -</u>
මේ අයවැය බංකොලොත් අයවැයක් විදිහට තමා කියන්න වෙන්නේ. අර ස්ථාවර තැම්පතු අපි මෙතෙක් අරන් නෑ. ඒවා ගැනීම නොකල යුතු දෙයක්. උප සභාපතිතුමා තව ලක්ෂ 50 කුත් දමන්න යෝජනා කලා. කැබ් එකට දාලා තියෙන වියදම ලක්ෂ 15 වැඩියි. 10 ක් කරන්න. උසාවි දඩ 2024 දි ලක්ෂ 190 යි. මෙවර 70 යි. මේ අයවැය විදිහට ලබන වසරේ සංවර්ධනයට තියෙන්නේ ලක්ෂ 300 ක විතර.ස්ථාවර තැම්පතු ගත්තොත්. නැත්නම් ඍන ශේෂයක්. නමුත් එය ගැනීම නුසුදුසුයි. අපි මහා සභාවේ තීරණයක් ගත්තා ඒකමතිකව සියළු මන්ත්‍රීවරුන්ට සමානව සංවර්ධනයටමුදල් ලබාදෙනවා කියලා. නමුත් ඒක සිදුවෙලා නෑ. එක සමානව බෙදන්න බැරිඋනත් මේ රින අයවැයෙන් මොනවා කරන්නද? මම පුද්ගලිකව

මේ අයවැයට විරුද්ධයි. මීට පෙර මේ අයවැය හැදුවේ මන්ත්‍රී වරු නුවරඑළිය, ඔහිය, බණ්ඩාරවෙල ගිහින් මේ කටයුතු ගැන ප්‍රාගුන්‍ය තියෙන නිලධාරියෙක් ගෙන්නලා උපදෙස් අරන් හරිම සතුටින්. නවක මන්ත්‍රීවරුන්ට දැනුම ලැබුනා. දැන් මේ කිසිම පුහුණුවක් නැතිව මේ කටයුත්ත සිදු කලේ. මල්කැකුළ සභාපතිතුමාගේ කාලේ විදේශ රටවලත් මන්ත්‍රීවරුන්ව ඇරියා සභාවටත් පාඩු නොවී. මේක පේල්. පොදුවේ සමාන මුදලක් දීලා නෑ. ඉදිරිය ගැනත් විශ්වාසයක් නෑ. ඒ නිසා බෙදීමක් ඉල්ලනවා.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා</u>
මේ අයවැයට සංශෝධන ඉදිරිපත් කිරිම බලාපොරොත්තු උනේ. ඒකට අවස්ථාවයි දුන්නේ. ඒ සංශෝධන එක්ක මේ අයවැය ඉදිරි වසරට සුදුසු ලෙස සකසමු. සියළු මන්ත්‍රී තුමන්ලා අදහස් දැක්වුවා. සම්මන්ත්‍රන ශාලාව පිලිබඳව ආයෝජකයෙක් ඉදිරිපත් වෙලා සිටින නිසා ඒ කටයුත්ත ඉදිරියට ගෙන යන්න පුළුවන්. මේ පිලිබඳව ඒ අයට දෙනවද වෙනත් ක්‍රමවේදයකට යනවද තීරණයක් ගමු.
වැටුප් සම්බන්ධව පසුගිය වසරත් එක්කයි මේ යෝජනා එන්නේ. ඒවා ක්‍රියාත්මක වෙමින් යන්නේ දැන්. නීතිමය තත්වයක්. ඒවාට මුහුණ දිමට හැකි ශක්තියක් නිර්මාණය කරගත යුතුයි. ආදායම් වැඩිකරගත යුතුයි. අයවැය හිඟය පියවාගනිමට ආදායම් උත්පාදන අත්‍යවශ්‍යයි. ඔබතුමන්ලා විශාල ලෙස දැක්වූ අදහස් අපි මේ සියල්ල එකතුකරගෙන ඉදිරියට යමු. කලිනුත් එදා සාකච්ඡා කරලා අපි යම් අදහස් ගත්තා. එදාත් බොහෝ දෙනෙක් ආවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>
කිරිඇල්ල හරක් මස් කඩේ හදන්න ඕනි. පොදු වැසිකිය වෙන අය අල්ලගෙන. ආදායම් උත්පාදනයට කිරිඇල්ලේ කිසිම මුදලක් වෙන්කරලා නෑ. කිරිඇල්ලට මුදල් වෙන්කරලා මදි. කිරිඇල්ලෙත් වෙළඳ ගොඩනැගිල්ලේ උඩ හදලා ටියුෂන් වලට වගේ දෙන්න පුළුවන්. මේ අයවැය පරන එකේ ඉලක්කම් මාරු කරලා. ගල්රෝල සභාවෙත් නෑ. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හදන එක හොඳයි. නමුත් වැසිකිලිය හැදුවේ නැත්නම් ආයේ කිරිඇල්ලේ යන්න බැරි වෙයි. ඒක ගරා වැටිලා. ජරාජීර්ණය වෙලා. මේ අයවැය මහාසභාවට ඉදිරිපත්කරන්න සංශෝධනය කරලා. මේකට අනුමැතිය දෙන්න බෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තනුජා දීපානි චන්ද්‍රිකා මිය -</u>

කුරුවිට නගරය හදපු දවසේ සිට තියෙන බිල්ඩිම මේ තාක් නඩත්තුවක් වෙලා නෑ. ජරාවට පත්වෙලා. සාකච්ඡා කලාට ඒ දේවල් අයවැයට ඇතුලත් වෙලා නෑ. ඒ නිසා මටත් මේ අයවැයට එකඟ වෙන්න බෑ. සභාව ආදායම් ගත්තට නගරයට ලැබෙන දේවල් නෑ. ඒගැනත් බලන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

කපිල මන්ත්‍රිතුමා කිව්වා පක්ෂ භේදයකින් තොරව එක්ව ගමන යමු කියලා. නමුත් ඒ අවබෝධය රජයට නෑ. වරදාන වල ඵලයක් ලෙස තමා මේ අයවැය දකින්නේ. මේ මාස ගානට පුද්ගලිකව මිස සභාවක් ලෙස මහජනතාවට උදව් කරලා නෑ. තත්වය මොකක්ද? මහජන නියෝජිතයින් ලෙස විපක්ෂයක් ලෙස අපිට යන්න බෑ. මේ අයවැය ගැන තීරණයක් ගැනීම පක්ෂය සමග කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මයා -
ඉඩංගොඩ කඩ වහලා. පෙර හිටපු මන්ත්‍රීවරයෙකුට හොඳම කඩ තුනක් දීලා. එතන උඩ ස්ලැබ් එකක් ගහලා. උත්සව ශාලාවක් දැම්මා නම් ආයෝජනයක් වෙයි. කබරගල් ඇල්ලටත් පුවරුවක් සවිකරමු. අඩු වියදමකින් යම් ලාභයක් ගමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -
හැමෝම හොඳ අදහස් කිව්වා. මිල්ලවිටියෙත් තියෙනවා මල් පුදන ඇල්ල. ඒකත් සංවර්ධනය කරමු. මමත් දායක වෙන්නම්. මොහාන් මන්ත්‍රීතුමා කිව්වට එතුමාගේ යෝජනා නෑ කියලා. එහෙම කියන්න බෑ. මම යෝජනා කරපු ඒවා ස්ථිර කලේ එතුමායි.
පරිසර කමිටුවේ සාමාජිකයෙකු ලෙසත්, විදුලි කාර්මික ශිල්පියෙකු ලෙසත් මම කියන්නේ නිසි කළමණාකරනයක් තුලින් මුදල් ඉතිරි කරන්න පුළුවන්. කොට්ඨාශ 26 ක් වසම් 56 ක් ලෙස ගත්තාම දළ වශයෙන් විදුලි බුබුළු 10000ට අධිකයි. ඇතැම් විට මේ විදුලි බුබුළු අක්‍රිය වෙලා තියෙන්නේ පිච්චිලා කියලා හිතුවාට ඇත්තටම පිච්චිලා නෙමේ. වයරයට සම්බන්ධවන ස්ථානයේ ඔක්සයිඩ නිෂ්පාදනය විම නිසා යම් අක්‍රිය විමක් විතරයි වෙලා තියෙන්නේ. මගේ ප්‍රෙද්ශයේ මම විශාල ප්‍රමාණයක් මම පරීක්ෂා කරලා හැදුවා. අළුතෙන් විදුලි බල්බයක් මිලදී ගන්නවාට වඩා විශාල මුදල් ඉතිරියක්. මේ කෙරේ අවධානය දෙන්න. සභාවට විශාල මුදලක් ඉතිරි වෙනවා. එසේම බල්බ් පිච්චිමකට ලක් වෙලා නම් එවැනි බල්බ් මහජන සභායත් අරන් ඒවා යථා තත්වයට ගැනීම සිදු කලොත් සභාවට විශාල ඉතිරියක්. එලෙස කැමැත්තෙන්ම ඉදිරිපත් වෙන ජනතාවත් ඉන්නවා. අංක 62 යටතේ ආදායම් ඉපයීම ක් දක්වලා තියෙනවා. කසළ සම්බන්ධව ගත්තොත් අපි පරිසර කමිටුව මේ සම්බන්ධව සෘජුවම මැදිහත් වෙනවා. කාබනික පොහොර හදලා අදාල බලපත්‍ර අරගෙන නිසික්‍රමවේද අනුව අලෙවි කිරිමට අපි සැලසුම්කලා. මේ කටයුතු කඩිනම් කිරිම කල යුතුයි. කසල ටික වෙන් වෙන්ව රැගෙන කළමණාකරනය කලොත් මේ කටයුත්ත පහසු වෙනවා. ඒ සඳහා වගකීමක් දරලා කටයුතු කල යුතුයි. නොදිරණ කසළ අංගනයේ කටයුතු විධිමත් විය යුතුයි. කසළ තෝරලා ගත්තොත් ඒ කටයුත්තත් පහසුයි. ඒ නිසා ඒකටයුතු කඩිනම් කිරිම කෙරේ අවධානය දෙමු. 2026 අයවැය කෙටුම්පතට අදාලව අවශ්‍ය අදහස් තව දුරටත් අරන් සංශෝධනය කරලා ඉදිරියට යමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා
කිරිඇල්ලට ලක්ෂ 25 ක් වෙන් කරලා තියෙනවා. මේ මුදල ප්‍රමාණවත් නොවෙන්න පුළුවන්. නමුත් මුදල් වෙන් කරලා. ඒ මුදල සංශෝධනයකට යන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා
උප සභාපතිතුමා කිව්වා වගේ අපි ජනතාවගෙන් අයකරන බදු මුදල් පෙරලා ජනතාවට ලැබෙන්න ඕනි. සභාවේ මූලික කාර්යභාරයක් කසළ කළමනා කරණය. මට දෙහෙරගොඩ ජනතාව, පාසැලේ විදුහල්පති, මේ ගැටළුව නිරාකරනය කිරිම ගැන නිතර කියනවා. මහජන සෞඛ්‍ය පරීක්ෂකත් කිව්වා මැසි උවදුර ගැන. පොහොරබාවට මුදල් වැඩිකළ යුතුයි. තාවකාලික විසඳුමකට වඩා ස්ථිර විසඳුමක් අවශ්‍යයි. ජනතාව නොඉවසිල්ලෙන් මේ කටයුත්ත දිහා බලන්නේ. මේක නිවැරදිව කලොත් කටයුතු සාර්ථක වෙයි. නිවැරදිව ඒ කටයුතු කරන්න. කසල කලමනාකරනය සම්බන්ධයෙන් පොහොරබාවට මුදල වැඩි කරන්න.
මේ ප්‍රෙද්ශයේ සංචාරක කර්මාන්තය යටතේ රුවන්පුරට දුම්රිය ආවාම කුරුවිට ලස්සන ගඟක් තියෙනවා. නානතොටක් පාලම ලඟම තියෙනවා. මේ නානතොටට පහසුකම් වැඩිකරලා ඒ ස්ථානය යම් ක්‍රමවේදයක් අනුව ආයමක් ලබන තැනක් බවට පත් කරන්න.
මනං ඇල්ල වගේ දියඇලිත් මේ ආදායම් වැඩිකරගන්න එකතු කර ගන්න. මේ ප්‍රෙද්ශයේ වැව් සීමිතයි. මැරේකැලේ ගල්පොත්තහේන වැව, අසල සංවර්ධනය කරන්න

ආයෝජිකයින් අහනවා. සභාව එක්ක කතා කරලා තීරණ ගමු කිව්වා. මම මේ ගැන කතා කලා. ඒ ස්ථානයට යන්න පුද්ගලික ඉඩම් නිසා මාර්ග ගැටළුව තියෙනවා. හෝටලයක්, බෝට්ටුසේවයක් ආදී ලෙස මේ ස්ථානය සංවර්ධනය කලොත් සභාවට ආදායම් ගත හැකියි. යම් මුදලක් වෙන් කරන්න. කනුගල්ලත් විශාල පිට්ටනියක් තියෙනවා. යෞවන සමාජ, තරුණ සමාජ තියෙනවා. මේ පිටිය පරිහරනය කරනවා. යම් සංවර්ධනයක් සිදුකර මේකත් ආදායමක් ලබන්න යොදාගන්න පුළුවන්.

ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා ක්ලීන් ශ්‍රී ලංකා පුස් වෙඩිල්ලක් කියලා. ඒක ඉතාමත් සාර්ථක ව්‍යාපෘතියක්. කසල විතරක් නෙමෙයි. විවිධ ක්ෂේත්‍ර පිලිබඳව ඒතුලින් කටයුතු කරනවා. අපි සභාවක් ලෙස එක්ව ජනතාවගේ සංවර්ධන කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>
අපි පසුගියදා සාකච්ජාවේදි අයවැය පිලිබඳව අදහස් ප්‍රකාශ කලා. මහාසභාවටත් අයෝජනා ඉදිරිපත් කලා. නමුත් අද මම කියන දේ හෙට තව කෙනෙක් වෙනත් විධිහකට කියනවා. මේ ජන්දෙන් පත්වෙලා ආවේ ජනතාවට සේවය කරන්න. නමුත් මේ විධිහට සිදුවෙන සේවය මොකක්ද? කතා වෙලා විතරක් වැඩක් නෑ. ප්‍රායෝගික විය යුතුයි. අද මේ කෙටුම්පත ඉදිරිපත් උනා. ඉතාමත් හොඳ අය එකතුකිරීමේ යෝජනා ඉදිරිපත් කලත් ඒවා නෑ. කුරුවිටට ආලෝකයක් ලැබෙන විධිහට ඉලක්කයක් වෙලා නෑ. ඉතා සුළු මුදලක් ආදායම් ලෙස පෙන්නලා. අයවැයෙන් මන්ත්‍රීවරුන්ට මුදල් වෙන්කිරීම තුලින් අපිත් කැමතියි ජනතාවට වැඩක් කරන්න. මගේ යෝජනාවක් ළමා උද්‍යානයක් හදන්න මන්ත්‍රී කෙනෙක් යෝජනා කරලා. කමක් නෑ. නමුත් මේක කතා මණ්ඩපයක් විතරක් වෙලා වැඩක් නෑ. ස්ථිර තැම්තු රැකගන්න. හෙට දවසක් ගැන හිතන්න ඕනි. මේ යෝජනා ඉදිරිපත් කරලා විතරක් වැඩක් නෑ. කිසි කෙනෙක් විරුද්ධ උනේ නෑ. සව්බල ගැන්වුවා විතරයි. තාක්ෂනය නැවුම්මගකට ගන්න කිව්වට ඒ වෙන්කල මුදලනම් මදි වෙයි.සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කරන්න පුළුවන් තාක්ෂනය මගිනුත්. ඒ කටයුතු අපි කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>
කරපිංච, මාටුවාගල මත්ද්‍රව්‍ය පාලනයට කිසිදු පියවරක් ගෙන නෑ. මේතාක් වතුවලට කසළ ටැක්ටරය යන්නේ නෑ. උපසභාපතිතුමා සමාජවාදි කිව්වාට එහෙම නෑ. කාල්මාක්ස්, මාඕසේතුං, ස්ටාර්ලිං යන මග ගිහින් නෑ. වත්තේ කුනුටික අදින්නවත් ටැක්ටරයක් වත් තාම ඇවිත් නෑ. ඒවාටත් මේ සේවය ලබා දෙන්න.

මෙම අවස්ථාවේදි ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම අනුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උපසභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් මහා සභාව පැය භාගයකට විවේකයක් සඳහා කල් තබන ලදී. වේලාව ප.ව. 1.45 විය. නැවත ප.ව.2.15 ට මහා සභාව රැස්විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -</u>
මන්ත්‍රී වරු නව ආදායම් මාර්ග පිලිබඳ අදහස් දැක්වුවා. සංචාරක ක්ෂේත්‍රය ගත්තාම ඒ හරහා සභා අරමුදල් වැඩිකරගැනිමට කරුණු දැක්වූවා. අපි මෙසම්බන්ධව පක්ෂ විපක්ෂ භේදයක් නැතිව විස්තර අරන් ලේඛනගතකරලා විශේෂ රැස්වීමක් තියලා හරි මේ කටයුතු කඩිනම් කරමු. ඒ කටයුතු සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ගන්න පුළුවන්.

කුරුවිට සූදාගල ඇල්ල ආශ්‍රිත ප්‍රෙද්ශය සභාවට පවරාගැනීම සම්බන්ධ කටයුතු ආරම්භ කරලා. ප්‍රාදේශීය ලේකම්ට ලිපියක් යවලා. ඒකට අවශ්‍ය අවස්ථාව දෙන්න කියලා. ඉදිරි ක්‍රමවේදය අනුව කටයුතු කරමු. වර්ණගල ආශ්‍රිතව කැළම්මන්ත්‍රීතුමාත් කතා කලා. අපි

එරත්න, සූදාගල එකතු වෙලා සභාවට ආදායම් එන ලෙස මේ කටයුතු කරමු. රනිල් මන්ත්‍රීතුමාත් මේකටයුතු සඳහා ඉන්නවා. අපිට සිරිපා සමයේ කඩ ටික ගත්තොත් විශාල ආදායමක් ලබන්න පුළුවන්. ඒ මුදලින් අපිට විශාල කාර්භාරයක් කරන්න පුළුවන්. මේ පිලිබඳව අවධානයක් දීලා කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී   මහින්ද ගුණසිංහ මහතා  -</u>

ඉදිරි වර්ෂය වෙනුවෙන් කුරුවිට ප්‍රාදේශිය සභාව සැළසුම්කල අයවැය ඉදිරිපත් කලා. ජනතාවට පහසුකම් වැඩිකලහැකි පරිදි පරිදි යෝජනා ඇතුලේ සැලසුම් කලේ. වඩා හොඳ සභාවක් හදලා වඩා හොඳ සේවයක් සැලසිය හැකි ලෙස හදපු මේ අයවැය සාර්ථකයි. ඒ් සංවර්ධන ව්‍යාපෘති සඳහා සුදුසු ලෙස මුදල් වෙන් කරලා සංවිධානගත වෙලා තියෙනවා. සාර්ථකයි. ඉදිරි වසරේ මේ අයවැයේ ඉලක්කගත ප්‍රතිලාභ ලැබෙයි.

<u>ගරු ප්‍රාදේශීය සභාපති අනිල් ලියනගේ මහතා  -</u>

අද දින විශේෂයෙන් කතා උනා පොල සංවර්ධන කටයුතු වගේම ප්‍රෙද්ශයේ සංචාරක කර්මාන්තය නංවා සිටුවීම පිලිබඳව. මේ අදහස් පිලිවෙලකට ගලපලා ඒ වැදගත් කරුණු එකතු කරමු. පන්කෝටි විසිපන්ලක්ෂයකට තියෙන උසාවි මුද්දර ගාස්තු හත්කෝටියකට උපකල්පනය කරලා. තුලනය කරන්නේ ස්ථාවර තැම්පත් වලින්. මේකට සංක්ෂිප්ත අයවැයක් ඕනි. පුද්ගලිකව මමත් විරුද්ධයි 20% ගෙවන එකට. කව්රු මූලාසනයේ හිටියත් ඒ කටයුතු චක්‍රෙල්ඛ ප්‍රකාරව ඉටු කරන්න වෙනවා. ඒක වෙනස් කිරිම වෙනම කාර්යක්. හැමෝටම සම අයිතිය දීම ට මමත් කැමතියි. නමුත් හැමොටම දෙන්නේ කොහොමද මට හිතාගන්න බෑ. අවුරුදු 25 ක් මාත් හිටියා. මෙවැනි අර්බුධයකට මූන දුන්නේ අද. අපේ ගෙවීම් වැඩි උනාට ආදායම් එකතු කිරිම් ඉලක්ක වලට ගිහින් නෑ. ස්ථාවර තැම්පතු නොතිබෙන්න මේ තුලනය කරන්නත් බෑ. ආදායම් උපකල්පනයක්. දෙමළ ප්‍රජාවට මොනවත් නෑ. ජන ජීවිතය පෝෂණය කරන්න මොකුත් කරන්නේ නැතිව ආයෙත් ඒ අයගෙන් ජන්දය නම් ඉල්ලන්න බෑ. මම උප සභාපති උනේ ඔබතුමන්ලාගේ කැමැත්තෙන්. ඒ කැමැත්ත නැත්නම් මට මේකෙන් අයින් වෙන්නත් පුළුවන්. මමත් මේ සභාවේ ගරුත්වය රැක්කා. මන්ත්‍රිවරුන්ගේ කටයුතු වලට මැදිහත් උනා. අධිකරණ ක්‍රියාවලිවලටත් යන්න උනා. මේ සියළු මන්ත්‍රීතුමන්ලා එක හා සමානයි. නමුත් ඒක භාවිතයෙන් ඔප්පු නොකලොත් වැඩක් නෑ. මටත් මේ එකඟ නැති දේවල් වලට කරුණු කියලා එකඟ කරවන්න බෑ. මංගල මන්ත්‍රි තුමා ලිබරල් අදහස් ඇති අයෙක්. නමුත් මගේ මිත්‍රයා. ජීවිතේ අතිශය දුක්සහගත කාරණා වලදි මෙතුමා මට ළඟින් හිටියා. මම ගොඩාක් දේ ඩයස් මන්ත්‍රතුමාගෙන් දැනගෙන තියෙනවා. ඒ දේශපාලන දර්ශනය විතරක් පිලිගන්නේ නෑ. බොතේජු මන්ත්‍රීතුමාත් කියන්නේ සරළ කරුණු නෙමෙයි. 2026 දි දෙන සම අයිතිය ගැන කියන චන්ද්‍රකුමාර් මන්ත්‍රීතුමා කිසිවෙක් කිසිදාක මට නොකිව්ව දේ කිව්වා. මහා පරිමාන දේ නෙමේ ඔහු ඉල්ලන්නේ.

වතු ජනතාවට පානීය ජලය ටිකක්, වතු ජනතාවගේ අපහසුතා වෙනුවෙන් එතුමා කතා කරන්නේ. අපි මේ දේවල් ඇතුල් කරලා සංක්ෂිප්ත අයවැයක් හදමු. අද සභාව ගැඹුරින් විග්‍රහකිරිම් සිදු කලා. ඒ සියළු යෝජනා සත්‍යයි. තවකව්රුහරි මේ කටයුත්තට මගපෙන්වන එක ගන්න අපිට මගඇරුණා. දේවින්ද මන්ත්‍රීතුමා, වචනයක් අල්ලගෙන ප්‍රහාර දෙන එක නවත්වමු. අපි නිවැරදි කරගමු. සියළු දත්ත ගලපලා මේ දින 365 අයවැය අපි හදමු. කිරිඇල්ලටත් අවධානය දෙමු. ඒ කාලෙත් මම උපසභාපති. මඩලින් එහා උප කාර්යාලය ජනතාව දන්නේ නෑ. එරත්නේ කැළුම් මන්ත්‍රීතුමා විශාල යෝජනා ප්‍රමාණයක් ඉදිරිපත් කලා. මම මේ 46 වම ඇත්තටම ගරු කරනවා. ලෙංගතුයි. මම වැරදි නම් විවේචනය

කරන්න. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු කියනදේවලුත් සලකා බලන්න. මේ අයවැය අද දවසේ අදහසුත් එක්ක ගලපලා ඉදිරි සභාවට දමන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

අද මේ කෙටුම්පත අනුමැතියටනේ ගෙනාවේ. සභාපතිතුමා කිව්වා කල් දාන්න බැකියලා. මංගල මන්ත්‍රීතුමා කිව්වා මේ කටයුතු අවසන් කරමු. කියලා. ඊටපස්සේ විවේකයක් ගත්තා. අපිව හැල්ලුවට ලක්කරන්න එපා. මේ 45 වම අදාල ගෞරවය දෙන්න. එදා වැයශීර්ෂ මාරු කලේ නෑ කිව්වේ බොරුවට. 2025.09.30 ඒක මාරු කරලා. අපි ඒවාට විරුද්ධ වෙන්නේ නෑ. එදා මල්කැකුළ සභාපතිතුමාට අපි සහාය උනා. බෙදීමක් මම ඉල්ලුවා. මම තනියෙන් හරි ඡන්දය දෙන්නම්. ඒ නිසා මම බෙදීමක් ඉල්ලනවා. මේ අවස්ථාවේම සංශෝධන කරලා අඩුපාඩුහදන්න. කිව්වාම ඊළඟ සභාවට දාන්න හදනවා. මට 11 දා සභාවට එන්න වෙන්නේ නෑ. ගිය වසරවල අයවැයේදි මේ තරම් අඩුපාඩු නොතිබිලත් ඔබතුමා ඡන්දය දුන්නේ නෑ. අපිත් ඔබතුමාව ආදර්ශයට ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -

නිති උපදෙස් පතන්න ඕනි දේවල් තියෙනවා. වැයශිර්ෂ මාරුකලේ නැකිව්වා. අපිට වට්ස්ඇප් කරලා සහකාර කොමසාරිස්ගේ ලියුමක්. වැයශීර්ෂ මාරුකිරිමට සභාපතිවරයාට පුළුවන් බව කියලා. මේවා අපි දන්නවා. අපි අහන්නේ ඒ වැයශීර්ෂ මාරුකිරීමේ බලය අයිතිය තිබුනාට ඒවායින් කරන වැඩවලට සභාවේ අනුමැතිය ගන්න ඕනි. උපසභාපතිතුමාත් මේවාට එකතුවෙලාද මන්දා? ඒ මුදලට කල දේ කියන්න. මීට පෙර මේ විදිහට වැයමාරුකරලා නෑ. ස්පීර තැම්පතුව අරන් නෑ. ආණ්ඩුකාර අනුමැතිය අරන් එක්කෝටිගානක වලදූරේ බිල ගෙවන්න. එහෙම බෑ. අපි ඒකේ පෝර හැදුවා දැක්කේ නෑ. ආදායමක් තියෙනවාද? නීති උපදෙස් අරන් කටයුතු කරන්න. සභාව නැති කාලේ උන දේවල්. කාර්මික කමිටුවට විද්වත් උපදෙස් පතනවා. මේ අවශ්‍ය දේවලට ඒ උපදෙස් ගන්නේ නෑ. මමත් මේ අයවැයට විරුද්ධයි.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

මේ කෙටුම්පත සංශෝධනය කරලා ඉදිරි සභාවට දාමු. යෝජනා රැසක් ඉදිරිපත් උනා. අපි මේවා සලකා බලා නැවත හදමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මගේ විනෝදාංශය දේශපාලනය. වැරදි දේ වැරදියි කියනවා. මම උදේම කිව්වා මේවාට මේ අයවැය බලන්න කල් මදි. කියලා. අද විශේෂ සභාවේ කරුණු දෙකක් විතරයි තිබුනේ. මම ඉතාමත් අපහසුවෙන් අද මේ සභාවට ආවේ දුරක ඉඳලා. මගේ පතල් ව්‍යාපාරයේ මැනික්ගලකුත් නැතිවෙලා. අද මට විශාල අවාසියක් උනේ. ඒ නිසා මම ඉල්ලනවා 50% ක් සමව ප්‍රතිපාදන දෙන්න කියලා. යෝජනා 49 ක් තියෙනවා. මේගමන සහාය නොදෙන එක ලබන ගමනත් එහෙමම තමා. මේ රැස්වීම අපිට වැදගත් නිසායි අද ආවේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

ප්‍රශ්න රැසක් මතු උනා. සභාපතිතුමාත් කියනවා මේක සංශෝධන එක්ක ඉදිරි සභාවට දමමු කියලා. උපසභාපතිතුමාත් කියනවා. මටත් එහෙම තමයි කරන්න වෙන්නේ. දේවින්ද මන්ත්‍රීතුමාට ප්‍රධාන ගැටළුව ප්‍රතිපාදන සම්බන්ධව. මේ සභාවේ බෙදිමක් තිබ්බොත් ඊළඟ සභාවේත බෙදිමකට යන්න බෑ. ඒ නිසා ගරු සභාපතිතුමා තීරණයක් ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය-

කෙදිනකවත් මෙහෙම උනේ නෑ. ඇයි මෙහෙම අඩුපාඩු? වැය ශීර්ෂ මාරු? ස්ථාවර තැම්පත් ගැනීම? මටත් බය හිතුනා. මේක නිවැරදිව කරමු. උපසභාපතිතුමා අදහසක් ගෙනාවා. මමත් ඒකට එකඟයි. ඒනිසා ලබන සභාවට සංශෝධන එක්ක මේක දමමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරේෂා උදයංගනී මිය-

ලබන සභා වාරයේ මමත් නෑ.

ගරු ප්‍රාදේශීය සභාපති අනිල් ලියනගේ මහතා -

මංගල මන්ත්‍රිතුමා ,දේවින්ද මන්ත්‍රිතුමා, කැළුම් මන්ත්‍රිතුමා රනිල් මන්ත්‍රිතුමා මේ අයගේ අදහස් යෝජනා නැතිව මේ වාර්තාව නැවත ඉදිරිපත්කරන්න එපා. මම උත්සාහා කරන්නේ මේ කටයුතුසාර්ථකව කරන්න. මේ තත්වයට මේ ආයතනය පත් උනේ කාගේවත් මේ සභාවේ වරදින් නෙමෙයි. සංක්‍රාන්ති කාලයේ සිදුවූ දෝෂ. වලදූරේ ව්‍යාපෘතියට කෝටිගානක් ගෙවන්න සිදුවෙලා. ඒක තමා මෙහෙම සිද්ධ උනේ. මහජන නියෝජිතයින් නැති කාලේ පළාත්පාලන ආයතනවලට වෙන දේ. ඒ නිසා කව්රුත් සම සමව වගකීම් දරලා මේ සභාව ගොඩගන්න කටයුතු කරමු. අධිභාර උනොත් ඒවා දරන්න පවුලේ අයටත් බැරි වෙයි. සාමූහික වෙමු. මේක කියන්නේ මම අවසන් වතාවට.මේ කරුණු සියල්ල එකතු කරලා ඉදිරි සභාවට දමන්න. සංක්ෂිප්ත අයවැයක්.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

මේ කෙටුම්පත සංශෝධනය කරලා ඉදිරි සභාවට දාමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව මහා සභා සම්මත විය.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව *කුරුවිට ප්‍රාදේශීය සභාවේ* **2026** වර්ෂයට අදාල අයවැය කෙටුම්පත තව දුරටත් අවශ්‍ය යෝජනා ලබාගෙන සංශෝධනය කොට සංශෝධිත අයවැය ඉදිරි මහා සභාවට ඉදිරිපත් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**01 – 02.** ඇමුණුම **1** හි සඳහන් අංක **01** සිට අංක **51** දක්වා වන සභා කර්මාන්ත ඇස්තමේන්තු සඳහා විශේෂ මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

ගරු මන්ත්‍රිතුමන්ලා ඉදිරිපත් කල ඇස්තමේන්තු ඉදිරිපත්කරලා තියෙනවා. පක්ෂ විපක්ෂ සියළු මන්ත්‍රිවරුන්ගේ යෝජනා තියෙනවා. වැයමාරුව සම්බන්ධව කොමසාරිස් උපදෙස්

අනුව සිදුකලේ. ඒවා ලිඛිතව ලබාගත්තා. අධිහාරවෙයි යන්න වැරදි මතයක්. අපි මේ වසරේ ප්‍රතිපාදන මදි උනොත් යම් ව්‍යාපෘතියක් සඳහා ලබන වසරේ හරි ඒවාට ප්‍රමුඛත්වය දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා-

මට නම් උපසභාපතිතුමා පවසන දේවල් එලෙසම පිලිගන්න බෑ. මම කතා කල යෝජනා මේකේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා-

එන්පීපී ව්‍යාපෘති 26 යි. ස්වාධීන හතයි, ස්වාධීන දෙකට දෙකයි, යුඇන්පී දෙකයි, පුටුව දෙකයි, දූරකථනයට පහයි, මාත් ඉන්නවා . සේරම 46 යි. සමහරුන්ට මේකේ අවස්ථාව ලැබිලා නෑ. මේ මුදලින් මේක කරන්න තිබුනා. ගමේ මිනිස්සු ලොකු බලාපොරොත්තු ඇතිවයි මේ අයට ඡන්දය දුන්නේ. විදි ලාම්පු, හියුම් පයිප්ප මේවාට දෙන්න අදාල කරගත හැකියි. වැයමාරුවට මහා සභාවේ අනුමැතිය අරන් නෑ. ස්ථිර තැම්පතු අරන් මේවා කරන්න එපා. මේ 46 දෙනාට ව්‍යාපෘති 46 ක් පැහැදිලිව දෙන්න තිබුනා. සමව දීමේ කටයුත්ත කරලා නෑ. මේ ප්‍රතිපාදන දීමේදී චෝදනා එන්නේ නැති විදිහට මේ කටයුත්ත කරන්න. මේ ගැන සැලකිල්ල දක්වන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-

දක්වා ඇති ඇස්තමේන්තු වලින් 47,48,49 ගැටළුවක් නෑ. වැයශීර්ෂ 170 න් සභාපතිවරයාට වැයශිර්ෂ මාරු කරන්න බලය තියෙනවා. නමුත් එය මහාසභාවට දැනගැනීමට මහාසභාවට ඉදිරිපත්කල යුතුයි. මේ යෝජනා වලට රු. ලක්ෂ 149 ක්. ඔබතුමාලා වැය මාරුකලේ මේකට. තව කීයක් හරි ඉතුරුවෙලා ඇති. මේක කලාට හැමෝටම මුදල් හම්බුවෙන්නේ නෑ. මෙතන තියෙන සමහර ව්‍යාපෘති කරලා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

1 සිට 8 දක්වා කලින් සභා අනුමැතිය අරන් තියෙන ව්‍යාපෘති. යෝජනා කරපුවා. 19 දක්වා සභාවේ තිබුණ ව්‍යාපෘති වෙන්කල මුදල් වලින් කිරිමට නියමිත ඒවා. 20 සිට තියෙන්නේ වැය මාරුවෙන් කරන්න නියමිත ඒවා. මේකේ සමහර ව්‍යාපෘති වෙන්කළ මුදලට වඩා අඩුවෙන් කරන්න තියෙන්නේ. ගයාන් මන්ත්‍රිතුමා, නිරෝෂා මන්ත්‍රිතුමිය ට කතා කළා. ඒ අය එකඟයි මේ මුදලට අඩු මුදලකින් ඒ කටයුත්තකරලා තවත් අයෙකුට මුදලක් දෙන්න. නමුත් මේ මුදල් වෙන්කලේ ඒ ඒ කටයුතු අනුව කටයුත්ත නිමකරන්න හැකියාව ලැබෙන ලෙසයි. ඇස්තමේන්තු කලේ. නමුත් ගයාන් මන්ත්‍රිතුමා, නිරෝෂා මන්ත්‍රිතුමිය කැමති උනා මේ කැපවීම කරන්න. සමහර අයට මේ වැයමාරුවෙන් කරන්න බැරිවෙයි. ඊළඟට ඉදිරියේදි ඒ අවස්ථාව දෙනවා. 46 ටම බෙදුවොත් එක් අයෙකුට ලක්ෂ දෙකයි දෙන්න වෙන්නේ. සීමිත විධිහට කලත් එක් අයෙකුට යෝජනාවකට රු. ලක්ෂ පහක් වත් දෙන්න ඕනි. සමහර යෝජනා වලට ඒ කටයුත්ත නිම වෙන්න ඕනි. ලක්ෂ තුනෙන් එහා වත් දෙන්න වෙනවා. මේ ස්ම්බන්ධයෙන් වෙන වෙන අර්ථකථන දෙන්න එපා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-

සභාවට යෝජනාව දැම්මට පස්සේ සම්මත කරගෙන ආයෙත් ඇස්තමේන්තුව සභා සම්මත වෙන්න ඕනි. ගොඩක් ඒවා සභාවට දාලා නෑ. මම කියන්නේ 50% ගානේ කරමු. ආණ්ඩු පක්ෂෙට 50% ට විපක්ෂයට 50% යි. මන්ත්‍රිලා නම් නොකර කරමු. මේක ඉල්ලීමක්

විතරයි. උදාහරනයක් ලෙස "ඒ" කියන මුදල විපක්ෂෙට දුන්නොත් ව්‍යාපෘති කිපයක් කරයි. ඒ ව්‍යාපෘති නියමිත ලෙස ඉටුකලයුතුයි. එම මුදලට අපි එක යෝජනාවක් හරි දෙනවා. මෙතන තියෙනවා ආණ්ඩුකාරතුමිය අනුමත කල ඒවා. සභාව පත් උනාට පස්සේ. ඒ බලතල සභාව පත් උනාට පස්සේ බෑ. සමහර යෝජනා සංශෝධනය කරලා.
සමරර ඒවා සංශෝධනය කරලා. සංශෝධනය කරන්නත් මහා සභාවට දාන්න ඕනි. අපි එක්ව යන්න නම් මෙතනින් පටන් ගමු. මේ සභාවේ සෘන ශේෂය වෙනුවට අපි ආදායම් වැඩිකරගෙන හරි අයවැයක් විධිහට ඉදිරියට යන්න උදව් කරන්නම්. සභාව ගෙනියන්න කාටවත් තනිව බෑ. විපක්ෂයේ සහාය ගත හැකියි. මේ කටයුතු සරලව සුගමව කල හැකියි. මේ කටයුතු මේ ආකාරයට බෑ. 50% ට පුළුවන් නම් ඉදිරියට යමු.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
50% ට නෙමෙයි. ප්‍රායෝගිකව කල හැකි දෙයක් විය යුතුයි. කව්රුවත් මුදල් දෙන්න එපා කියලා නෑ. මේ ප්‍රතිපාදන දෙනකොට පොලවේ කල හැකි ලෙසයි දිය යුත්තේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා-</u>

50%ට නම් සුදුසු නෑ. මෙතන වගකිම් රැසක් තියෙනවා. එය සාධාරන නෑ. දෙන්න පුළුවන් ප්‍රමානයකට යමු. විසල් රත්නපුර මාර්ග කැඩිලා වසර පහක් වෙනවා. බටුගේන දක්වා කරලා. අපේ ගම්වල ඒවා කෙරිලා නෑ. මෙතන තියෙන්නේ තුනක් විතරයි. විසල් ඒවා පහක් තියෙනවා. ඒ මුදල් වෙන ඒවාට ගන්න බෑ. ඒ මුදල ඒවාට යොදවන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරල මිය -</u>
විසල් ඒවා අපි ඒකාලෙම කලා. මෙතරම් කාලයක් ඒමුදල් තියාගත්තේ මොකද අහයි. ඒ මුදල් අදාල කටයුත්තට යොදවන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
ඒ කාරණාවට එකඟයි. 46 ටම ලක්ෂ 10 ගානේ දුන්නත් කෝටි හතරක්. ලක්ෂ පහට ගියත් ඉන් අඩක්. මේ සභාව පිහිටුවන කොට වෙන සභාපති කෙනෙක් පත් උනානම් මේ විධිහට වෙන්නේ නෑ. නමුත් අපි එකඟයි. මන්ත්‍රිතුමන්ලා එකඟයි. ඒ අයට ගෞරවයක් ලෙස කියන්නේ. මේ මුදල ඇතුලේ මගේ යෝජනා නෑ. උපසභාපතිතුමාගේ නෑ. සහාය දුන්න 26 ඇතුලේ දාපු නැති අයත් ඉන්නවා. ඒ නිසා 50% 50% ඉල්ලන්න එපා. සාධාරණ වෙන්න. නමුත් මම විශ්වාස කරනවා හැමෝටම ප්‍රතිපාදන ලැබෙන්න ඕනි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
අද දිවා ආහාරයත් නැතිව මේ ඉන්නේ. මේ කටයුත්ත කල් අරින්න එපා. යම් යෝජනාවක් මහා සභාවේ අනුමත උනාම ඒකේ ඇස්තමේන්තුවටත් සභා අනුමැතිය ගන්න ඕනි. එතකම් වඩෙ පටන් ගන්න බෑ. පස්සේ අදාල මන්ත්‍රීවරයා මූලාසනයට දැනුම් දීලා විෂය ලිපිකරුට යොමුකරලා මූලාසනයේ දැනුවත්වීම සමග නීත්‍යානුකූලව කටයුතු කරන්න පුළුවන්. වැය මාරුකිරිමත් සභාපතිවරයාට ඒකට බලය තිබුනාට ඒකටයුත්තගැන මහාසභාව දැනුවත් කල යුතුයි. ආණ්ඩුකාර අනුමැතියෙන් වැඩ කලාට මහා සභාව පත් උනාට පස්සේ ඒ අනුමැතිය මහාසභාව සතු බලයක්. මේක කෙටියෙන් හදමු. සභිකවරුන්ට දෙන්න පුළුවන් සාධාරණ මුදලකට යමු. මල්කැකුළ සභාපතිතුමාගේ කාලේ ලක්ෂ 50 ක් දීලා තියෙනවා. තව උපක්‍රම භාවිතා කලා. කපටි වැඩ නෙමේ. ඒවා උපක්‍රම.

2026 සංවර්ධන යෝජනා වලින් 30% හෝ 20 ක් කරමු. ඊට වඩා පුළුවන්නම් ඒකටත් එකඟයි. සභා යෝජනා අනුමැතිය ගන්න එක කමිටු වලින් බෑ. මහාසභාවට දාන්න ඕනි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා-

**ආණ්ඩුකාරතුමා අනුමත කලඡ්වා කරපු සමිතියට ගෙවලාද? සභාවෙන් අනුමත කලාම අපිටයි ගෙවන්න වෙන්නේ. සමිතිය නෙමේ. ගලුකාගම පාරේ වලවල් වහන්න එකක් කලා. හාරලක්ෂ ගානක එකක්. ආණ්ඩුකාර අනුමැතියෙන් කලාම අපි අත උස්සන්න ඕනිද? මගේ කොට්ඨාශෙ. මිටර් 100 ක්වගේ වැහුවේ. පාරේ වලවල් හාරනවා වගේ ඉල්ලං හාරලා. පස්සේ බොරළු පස් දාලා වැහුවා. අදාල මන්ත්‍රිවරයාත් ඉන්නවා. අහන්න. මේ වා කලාම අපි අත උස්සන්න ඕනිද? ඉංජිනේරුවාටත් කිව්වා. බැකෝදාලා ගරලා. වීඩියෝත් තියෙනවා. මේවා කිව්වාට සොයා බැළුවේ නෑ. මේ අයවැය ස්ථිර කලොත් ඉස්සෙල්ලාම ගෙවන්න වෙන්නේ ඒවාට. විජේසිරි මන්ත්‍රිතුමා කිව්වා මේ ප්‍රතිපාදන දුන්න විදිහ. තෝරා ගත් සජපයේ අයටත් දීලා. මංගල මන්ත්‍රිතුමා කිව්වා සේරටම සමව දෙන්න කියලා. තෝරාගත්ත පිරිසකට ප්‍රතිපාදන දීලා. මෙහෙම දුන්නට විපක්ෂය හැල්ලුවට ලක් වෙන්නෑ. විජේසිරි මන්ත්‍රිතුමා කිව්වා සේරටම දුන්නනම් හරිනේ කියලා.**
**සංශෝධනය කල හැකියි කියලත් කිව්වා. මම යෝජනා කලෙත් නෑ. කරන්නෙත් නෑ. අනුන්ගේ පානෙන් එලිය බලනවා කිව්වේ මට. දවසක ඔබතුමා අර පාරට ආවොත් මම පෙන්වන්නම්. හරියට වැඩ කරන්නකෝ. ඔබතුමාට මතක නැති උනත් මමත් ඔබතුමා එක්ක හිටියා. පෙර සභාවක. ආණ්ඩු පක්ෂයේ ප්‍රබල දෙන්නෙක් ඔබතුමාට විරුද්ධව කටයුතු කරන්න හදනකොට මම විතරයි ළඟට ආවේ. ඒවාට විරුද්ධව. අද මෙහෙම සැලකීමක් ?. මට සංවර්ධන යෝජනා එපා. සභාවක් විධිහට වැඩ කරමු. 50%50% ඉල්ලීම අසාධාරනයි. අපි දන්නවා. නමුත් මේ කරලා තියෙන විධිහට බෑ. මුදල් බෙදලා දෙන්න තිබුනා. අපි සභාපතිවරුන්ට මුල සිටම සභාවට සහාය දුන්නා. අයවැයට හිටියා. අපි එකඟ උනා. නමුත් මේ විධිහට කටයුතු කරන්න බෑ. විජේසිරි මන්ත්‍රිතුමාට කවදාවත් මෙතරම් මුදලක් ලැබිලා නෑ. සමහරු ජන්දේ ඉල්ලද්දි මහගෙදර. දිනුවට පස්සේ මහගෙදරට ගරහනවා. ගෞරවයක් තියාගන්න. අපි හැදුවේ සභාව පෙල්ලන්න නෙමේ. මේ වැරදි නිවැරදි වෙන්න ඕනි. ආයේ කරන්න එපා. මේ මුදල් අපතේ යයි. තෝරාගෙන මුදල් දිම ගැන විරෝධය දක්වනවා. මම කෝටි 40 කට වඩා ගමට වැඩ කල අයෙක්. ඩග්ලස් මන්ත්‍රිතුමාත් වැඩ කලා. යහපාලන කාලේ. මලගෙදර මගුල් ගෙදර ගිහින් මිනිස්සු එක්ක කතා කලා. ඒ අය එක්ක හිටියා. මුදල් රනිල් මන්ත්‍රිට දුන්නට තරහා නෑ. ඒතුමාත් කෝටි ගානක වැඩ කලා. අළුත් පිරිස? ඒඅයට දෙන්නේ කොහොමද? ස්ථිර තැම්පත් ගන්න වෙනවා. මේ ප්‍රදේශයේ විශාල ප්‍රශ්න තියෙනවා. ඒවාත් වැදගත්. අළුත් මන්ත්‍රිවරුන්ට කියන්නේ. මේක අධිහාරෙකට යනවා. ඒක ගෙනියන්නෙත් මම. පාරවල් බොරළු දාලා වහලා දාලා. නීතිමය පියවර ගන්න පෙර ඒඅවශ්‍ය තැන්වලට පිලියම් යොදන්න. හොඳ අධීක්ෂනයක් යටතේ කරන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා-

**අපි එකතුවෙලා කතා කරමු. ජනතාව වෙනුවෙන් මේ කටයුත්ත හරියට කරමු. කුමන ගැටළුව තිබුනත් අපි සභාපතිතුමාට සහාය වෙනවා. ක්‍රමවේදය හදාගමු. ඇස්තමේන්තු සභාවට දැම්මානම් හරි. පනතේ තියෙනවා පරිපූරකය පිලිබඳ කටයුතු කිරිම ගැන. අවශ්‍ය සියල්ල මේවා පනතේ තියෙනවා. 30% එකඟ වෙමු. මේ සියල්ල හදාගෙන ඉදිරියට යමු. මංගල මන්ත්‍රිතමා 30% ට එකඟ වෙන්න. ප්‍රායෝගික වෙන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා-

**මාර්ගය සම්බන්ධව දක්වපු අදහස් ප්‍රතික්ෂේප කරනවා. ඒ ප්‍රකාශ අසත්‍යයි. පක්ෂය අපහසුතාවට පත්කරන්න කියන ඒවා. කහංගම කරපිංච මාර්ගය අධීක්ෂනය කලේ මම. එතන ගෙයක් තියෙනවා. ඒ ගෙදරට පාරකපලා වතුර බටයක් දාන්න ඕනි. ඒකට අවශය අනුමැතිය ගත්තා. රු. 1500 ක් බැන්දා. අඩි තුනක් විතර යටට බටය දාලාගන්න ඕනි. එතන**

කලින් පතල් කපපු තැනක්. පෙර කපපු වලක්. මේපාර ගිලාබහියි කියලා අඩි 15 ක් 20ක් විතර කට්ටේ සූරලා හදලා . සීසිටිවී දර්ශන තියෙනවා. ඊ 11.45 ට විතර මේ වැඩ කලේ. මේ අය කියනවා බැකෝ එකෙන් ඉල්ලංගත්තා කියලා. මටත් සැක නිසා මාත් බැළුවා. අර ඒබිසි බෝක්කුව ලඟට දාලා තුනීකරලා. හතරට විතර වහිනවා. හැමතැනම මඩ වෙලා. මේවායේ දර්ශන තියෙනවා. පස්ටික දාලා ඉල්ලං ගත්තා කියලා ප්‍රචාරය ඇරලා. කාර්මික නිලධාරිත් ආවා. ඇත්ත ඒක තමයි. මේකටයි මේ බොරු ප්‍රචාරයක් දෙන්නේ. ඕනි අයට බලන්න මම මේ සීසීටිවී දර්ශන දෙන්නම්.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

ඩග්ලස් මන්ත්‍රීතුමා, ජස්ටින් මන්ත්‍රීතුමා, දේවින්ද මන්ත්‍රීතුමා වගේම මටත් සම්බන්ධයක් කොස්ගල ගමට තියෙනවා. මගේ ඥාතින් විශාල පිරිසක් ඉන්නවා. මේ මාර්ගය ගැන මටත් තොරතුරු ආවා. මේ පක්ෂ භේද ගමට එපා. වැඩ විතරක් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා-</u>

උගත් පිරිසක් මේ සභාවේ ඉන්නේ. සියළු දෙනා සහාය වී ගමට වැඩ කරන්න. මේ මාර්ග සම්බන්ධව ගැටළුවක් තියෙනවා නම් කාර්මික නිලධාරිට වගකීමක් තියෙනවා ඒ ගැන සොයාබලා අවශ්‍ය පියවර දැනුම්දීමට. වැරැද්දක් වෙනවා නම් අදාත තැනට යොමුකල යුතුයි. අවශ්‍යතැනට අවශ්‍ය දේ විතරක් කතාකරමු.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

30% මුදල අපි ඒ කණ්ඩායම් වලට වෙන්කරමු. ගැටළු කිපයක් මතුඋනා. පොදු මාර්ග හදද්දි යම් ගැටළුවන් තියෙනවා නම් අදාල නිලධාරියාට යොමු කරන්න. ඒ දේවල් පරික්ෂා කරලා වාර්තා අරන් කටයුතු කරන්න පුළුවන්. උක්වත්ත මාර්ගය, රණවිරු මාර්ගය පිලිබඳව ඉදිරි සභාවේදි තොරතුරු දෙන්නම්. කිතුල්පෙ මාර්ගය පිලිබඳවත් වගකීම නිලධාරින් දරනවා. සොයාබලා ඒ පිලිබඳව කටයුතු කරමු. සංශෝධිත ඇස්තමේන්තුව ඉදිරි සභාවට යොමු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව මහා සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව ඇමුණුම 1 හි සඳහන් අංක 01 සිට අංක 51 දක්වා වන සභා කර්මාන්ත ඇස්තමේන්තු සඳහා විශේෂ මහා සභා අනුමැතිය ලබාදීම ටත් 30% ක ව්‍යාපෘති ප්‍රතිපාදන සභාවේ අනෙකුත් පක්ෂවල සභිකයන් විසින් ඉදිරිපත්කරන මහජන අවශ්‍යතා සම්බන්ධ ඇස්තමේන්තු සඳහා ලබාදීමටත් ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

මේ අවස්ථාවේදී න්‍යාය පත්‍රෙය් නොමැති යෝජනාවක් ලෙස ඉදිරි මහා සභාව පැවැත්විමට නියමිත දිනය වන 2025.11.11 දින සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා 17 කට එදිනදී අත්‍යාවශ්‍ය වැඩසටහනක් යෙදී ඇති බැවින් එදිනට සහභාගීවිමට නොහැකි බැවින් 2025.11.17 දින දී එම සභාව පැවැත්වීමට කටයුතු කරන ලෙස යෝජනා කරමින් ලේකම් වරයා වෙත භාරදී තිබූ ලිඛිත යෝජනාවක් ගරු සභාපතිතුමාවෙත භාරදෙන ලදී. අදාළ ලිපියේ අත්සන් තබා තිබූ මන්ත්‍රිවරුන් ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

කේ. කේ. දයාවතී මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ඉරෝෂා උදයංගනි මිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගඟබඩගේ මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ආශා සමන් කුමාරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී තනූජා දීපානි චන්ද්‍රිකා මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා **යන සභිකතුමන්ලා අත්සන් තබා තිබුණි.**
**ඒ අනුව ඉදිරි මහා සභාවට සංශෝධිත අයවැය ද ඉදිරිපත් කිරිමට නියමිත බැවින් සියළු කරුණු සළකා බලා ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් ඉදිරි මහා සභාව 2025.11.17 දින පැවැත්විමට යෝජනා කල අතර එම යෝජනාව ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව 2025.11.11 දිනට නියමිතව තිබූ මහා සභා රැස්වීම 2025.11.17 දින පැවැත්වීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් මෙදින විශේෂ මහා සභාවට සහාය ලබාදුන් ගරු උපසභාපතිතුමාට, සියළු ගරු මන්ත්‍රිවරුන්ට හා කාර්යමණ්ඩලයට ස්තුතිය පල කලඅතර විශේෂ මහා සභාවේ කටයුතු ප.ව. 4.30 ට අවසන් විය.**

***එම්. විකසිත පුෂ්පසූරිය ,***
***සභාපති,***
***ප්‍රාදේශීය සභාව,***
***කුරුවිට.***